# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,072 - 2018 මැයි මස 18 වැනි සිකුරාදා - 2018.05.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

### තනතුරු ඇබෑර්තු

අධ්‍යාපන අමාත්‍යාංශය

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ පැරණි සේවා ව්‍යවස්ථාව අනුව 2-1 ශ්‍රේණිය නිලධාරීන් 1 පන්තියට උසස් කිරීම**

අංක 1070/13 හා 1999.03.11 දිනැති අති විශෙෂ *ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධ කරන ලද හා 1995.01.01 දින සිට ක්‍රියාත්මක ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ සේවා ව්‍යවස්ථානුකූලව, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 1 පන්තියේ (අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයන්හි සහ ගුරු විද්‍යාලයන්හි) 2015.07.28 දින දක්වා පහත පරිදි පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් අයදුම්පත් භාරගනු ලැබේ. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළකරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතීනම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

| *දිනය* | *පුරප්පාඩු ගණන* |
|---|---|
| 2014.01.01 | 3 |
| 2014.07.01 | 2 |
| 2015.01.01 | 1 |
| 2015.07.01 | 2 |
| **එකතුව** | 8 |

02. මෙම නිවේදනයේ පහතින් දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත්, 2018 ජූනි මස 08 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු යි. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 1 ට උසස් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතු ය. සියලුම අයදුම්කරුවන් විසින් අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

3.1 තෝරාගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය සේවයේ උසස්වීම්වලට අදාළ සාමාන්‍ය කොන්දේසිවලට සහ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් හා කොන්දේසිවලට සහ ඒවාට අදාළව වරින් වර නිකුත් කරනු ලබන සංශෝධන වලට ද, ආයතන සංග්‍රහයට ද, මුදල් රෙගුලාසි වලට ද, අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරනු ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 1 පන්තියට උසස් කරනු ලැබේ.

3.2 තනතුරු සඳහා තෝරා ගනු ලබන අපේක්ෂක අපේක්ෂිකාවන් සේවා අවශ්‍යතාවය අනුව කුමන අධ්‍යාපන විද්‍යාපීඨයක/ ගුරු විද්‍යාලයක වුව ද සේවය කිරීමට බැඳී සිටී.

04. *සාමාන්‍ය සුදුසුකම් :*

4.1 ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාවේ 17 වැනි වගන්තිය අනුව උපාධිය ලබා ඇත්තේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් නොවේනම් උසස් කිරීම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලැබීම පිණිස අ.පො.ස. (සා.පෙළ.) හෝ ඒ හා සමාන විභාග යක දී ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ එයට උසස් සහතිකයක් ලබා තිබීම අවශ්‍යතාවක් වනු ඇත.

05. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

5.1 ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 වැනි පන්තියේ I වැනි ශ්‍රේණිය යටතේ උපලේඛනගත තනතුරක පස් වසරකට නොඅඩු සතුටුදායක සේවයක් සම්පූර්ණ කර එනම් එක් එක් පුරප්පාඩුව ඇති වූ දිනට පූර්වාසන්න පස් අවුරුදු සේවා කාලය තුළ විනය දඬුවමකට භාජනය නොවීමෙන් හා වැටුප් වර්ධක උපයා ගැනීමෙන් සතුටුදායක සේවයක් සම්පූර්ණ කර සේවයේ ස්ථිර කරනු ලැබ ඇති නිලධාරීන්ට පහත දැක්වෙන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් තෘප්ත කර තබේ නම් අයදුම් කළ හැකි ය.

5.2 (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අධ්‍යාපනය පිළිබඳ පළමු පන්තියේ හෝ දෙවන පන්තියේ (ඉහළ) උපාධියක් ලබා තිබීම හෝ අධ්‍යාපනය පිළිබඳ ඉහළ උපාධියක් ලබා තිබීම; හෝ

( ආ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ උපාධියක් ලබා තිබීම සහ විශිෂ්ඨ හෝ සම්මාන හෝ සාමාර්ථයක් සහිතව පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ අදාළ විෂයය ක්ෂේත්‍රයෙන් පශ්චාත් උපාධියක් ලබා තිබීම; හෝ

( ඇ ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් පළමු හෝ දෙවන පන්තියේ (ඉහළ) සාමාර්ථයක් සහිතව උපාධියක් හා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ අදාළ විෂයය ක්ෂේත්‍රයෙන් හෝ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

06. *තෝරා ගැනීමේ ක්‍රමය :*

6.1 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් එම කමිටුව විසින් අනුමත කරනු ලැබූ ලකුණු පටිපාටියකට අනුව පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගනු ලැබේ.

6.2 සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ පහත සඳහන් ලිපි ලේඛනවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

6.2.1 සම්මුඛ පරීක්ෂණ කැඳවීම් ලිපිය

6.2.2 උප්පැන්න සහතිකය

6.2.3 ජාතික හැඳුනුම්පත

6.2.4 ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 වැනි පන්තියේ I වැනි ශ්‍රේණියේ පූර්වාසන්න වසර පහ (05) ක කාලය තුළ ලබා ඇති වැටුප් රහිත හා අඩ වැටුප් සහිත නිවාඩු පිළිබඳව, විනය හා විගණන පරීක්ෂණ ඇති/නැති බව, වැටුප් වර්ධක උපයා ගැනීම් පිළිබඳව සඳහන් කරමින් අදාළ ආයතන ප්‍රධානියා වෙතින් ලබා ගත් සේවය සනාථ කිරීමේ ලිපිය

6.2.5 මූලික සුදුසුකම්වලට අදාළව සහ ලකුණු පටිපාටියට අදාළව ලකුණු ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය සියලු සහතික සහ ලිපි ලේඛන

6.2.6 වෘත්තීය සුදුසුකම් සඳහා අදාළ සහතික සහ ලිපි ලේඛන

6.3 පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් සංඛ්‍යාවක් පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව සතු වේ.

6.4 සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී අවශ්‍ය ලිපිලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයගේ අයදුම්පත් ගැන සළකා බලනු නොලැබේ.

සැ.යු. : කිසිදු සහතිකයක් හෝ පිටපත් අයදුම්පතට ඇමිණිය යුතු නොවේ.

07. *වැටුප් පරිමාණ :*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව SL 1-2006 වැටුප් කාණ්ඩය යටතේ වන රු. 22,935 - 10x645 - 8x790 - 17x1,050 - රු. 53,555 (මාසික) වැටුප් පරිමාණය අදාළ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි,

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2018 මැයි 14 වැනි දින.

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ පැරණි සේවා ව්‍යවස්ථාව අනුව 2-I ශ්‍රේණියේ නිලධාරීන් 1 පන්තියට උසස් කිරීමේ ලකුණු පරිපාටිය**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 1 පන්තියට ඉල්ලුම් කිරීමට අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව එක් එක් නිර්ණායක යටතේ ඇති සුදුසුකම් එකක් හෝ කිහිපයක් සඳහා උපරිමයට යටත්ව ලකුණු ලබා දෙනු ලබන අතර එක් සහතිකයක් සඳහා එක් නිර්ණායකයක් යටතේ පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

01. **සේවා පළපුරුද්ද** — **උපරිම ලකුණු 50**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-I ශ්‍රේණියට උසස්වී වසර 5ට වැඩි අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා එක් වසරකට ලකුණු 10 බැගින් උපරිම වසර 5 ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

02. **අතිරේක අධ්‍යාපන සුදුසුකම්** — **උපරිම ලකුණු 20**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි පිරිනැමීමේ ආයතනයක් ලෙස පිළිගත් ආයතනයකින් ලබා ගත්,

2.1 ආචාර්ය උපාධිය - 20

2.2 පශ්චාත් උපාධිය - 15

2.3 පශ්චාත් උපාධි ඩිප්ලෝමා - 10

(අධ්‍යාපන හෝ අධ්‍යාපන කළමනාකරණ නොවන)

03. **ඉංග්‍රීසි භාෂා නිපුණතාවය** — **උපරිම ලකුණු 10**

(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබා ගත් සහතික සඳහා පමණක් ලකුණු හිමිවේ)

3.1 ඉංග්‍රීසි මාධ්‍යයෙන් පශ්චාත් උපාධියක් හදාරා තිබීම - 10

3.2 ඉංග්‍රීසි විෂයය පිළිබඳ/ඉංග්‍රීසි විෂයය ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම - 08

3.3 ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා ලබා ගත් සහතිකය (වසරක් හෝ ඊට වැඩි) - 06

3.4 ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා ලබා ගත් සහතිකය (වසරක් හෝ ඊට වැඩි) - 04

3.5 ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා ලබා ගත් සහතිකය (මාස 6 ක් හෝ ඊට වැඩි) - 03

3.6 ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා ලබා ගත් සහතිකය (මාස 6ක් හෝ ඊට වැඩි) - 02

(3.3 සිට 3.6 දක්වා සහතික පත්‍රවලට ලකුණු ලබා දෙනුයේ සහතික පත්‍රයේ හෝ විස්තරාත්මක ලකුණු ලේඛනයේ (Transcript වල) අදාළ පාඨමාලාවේ කාලය සඳහන් නම් පමණි)

04. **දෙවන භාෂා සන්නිවේදන හැකියාව** — **උපරිම ලකුණු 05**

(පත්වීම් මාධ්‍ය සිංහල මාධ්‍ය වන නිලධාරීන් සඳහා දෙමළ භාෂාව සඳහා ද පත්වීම් මාධ්‍ය දෙමළ මාධ්‍ය වන නිලධාරීන් සඳහා සිංහල භාෂාව සඳහා ද ලබා ගත් සහතික සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.)

4.1 රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සිංහල/දෙමළ I මට්ටම සමත් හෝ අ.පො.ස. (සා.පෙළ) දෙවන බස සිංහල/දෙමළ විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ වාචික පරීක්ෂණය I මට්ටම සමත්වීම - 05

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීන් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 ජූනි මස 08 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2018 මැයි මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

4.2 රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සිංහල/දෙමළ II මට්ටම සමත් හෝ අ.පො.ස. (සා.පෙළ) දෙවන බස සිංහල/දෙමළ විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ වාචික පරීක්ෂණය II මට්ටම සමත්වීම - 04

4.3 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් සිංහල/දෙමළ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම (මාස 6 ක් හෝ ඊට වැඩි) (මේ සඳහා ලකුණු ලබා දෙනුයේ කාල සීමාව අදාළ සහතිකයේ සඳහන්ව ඇත්නම් හෝ අදාළ ආයතනයෙන් කාලය පිළිබඳව සහතිකයක් ලබා දී ඇත්නම් පමණි) - 03

**05. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම** **උපරිම ලකුණු - 10**

5.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳව පශ්චාත් උපාධියක් ලබා තිබීම - 10

5.2 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම - 08

5.3 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකය (වසරක් හෝ ඊට වැඩි) - 06

5.4 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකය (වසරක් හෝ ඊට වැඩි) - 04

5.5 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකය (මාස 6ක් හෝ ඊට වැඩි) - 03

5.6 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකය (මාස 6ක් හෝ ඊට වැඩි) - 02

(5.3 සිට 5.6 දක්වා ලකුණු ලබා දෙනුයේ අදාළ කාලසීමාව සහතිකයේ සඳහන්ව ඇත්නම් හෝ අදාළ ආයතනයෙන් කාලය පිළිබඳ සහතිකයක් ලබා දී ඇත්නම් පමණි.)

**06. සේවා ඇගයීම්** **උපරිම ලකුණු 05**

අධ්‍යාපන ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පොදු 230 බී ප්‍රශංසා හා දෝෂ දර්ශන ආකෘතිය අනුව විධිමත් පරිදි නිකුත් කරන ලද සේවා ඇගයීම් (එකකට ලකුණු 1 බැගින් උපරිම සේවා ඇගයීම් 5 ක් සඳහා)

**මුළු ලකුණු 100**

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ පැරණි සේවා ව්‍යවස්ථාව අනුව**
**2-1 ශ්‍රේණිය නිලධාරීන් 1 පන්තියට උසස් කිරීම**

ආදර්ශ අයදුම්පත්‍රය

(A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කර ගත යුතු ය.)

01. (i) මුලකුරු සමග නම (සිංහලෙන්)
පූජ්‍ය :————. (හිමි/මයා/මිය/මෙනවිය)
මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
Rev/Mr/Mrs/Miss :————.

(ii) මුලකුරු වලින් හැඳින්වෙන නම් :————.

02. (i) රාජකාරි ලිපිනය :————.
(ii) පෞද්ගලික ලිපිනය :————.
(iii) පෞද්ගලික දුරකථන අංකය :————.

03. (i) උපන් දිනය :————.
(ii) ජාතික හැඳුනුම්පත් අංකය :————.

04. (i) මුල් පත්වීමේ දිනය හා ශ්‍රේණිය/පන්තිය :————.
(ii) වර්තමාන ශ්‍රේණිය/පන්තිය හා එයට පත් වූ දිනය :————.
(iii) වර්තමාන සේවා ස්ථානය :————.

05. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :

(i) පළමු උපාධිය

| උපාධියේ නම සහ නිකුත්කළ ආයතනය | වර්ෂය | පන්තිය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ii) පශ්චාත් උපාධිය

| සහතිකයේ නම සහ නිකුත්කළ ආයතනය | වර්ෂය | පන්තිය | විශිෂ්ඨ/සම්මාන/සාමාන්‍ය ද යන වග |
|---|---|---|---|
| | | | |

(iii) අධ්‍යාපන ඩිප්ලෝමාව

| සහතිකයේ නම සහ නිකුත්කළ ආයතනය | පාඨමාලාවට ගත වූ කාලය | විශිෂ්ඨ/සම්මාන/සාමාන්‍ය ද යන වග | විෂයයන් පිළිබඳ විස්තර |
|---|---|---|---|
| | | | |

(iv) වෙනත් වෘත්තීය සුදුසුකම් (ඩිප්ලෝමා සහතික හා පුහුණු ගුරු සහතික පිළිබඳ විස්තර)

| සහතිකයේ නම සහ නිකුත්කළ ආයතනය | පාඨමාලාවට ගත වූ කාලය | විෂයයන් පිළිබඳ විස්තර |
|---|---|---|
| | | |

(v) ඉංග්‍රීසි භෂාව පිළිබඳ ප්‍රවීණතාවය ඃ

| අ.පො.ස. සා/පෙළ | විශිෂ්ඨ ද/ සම්මාන ද/ සාමාන්‍ය ද යන වග | ප්‍රතිඵල වලංගු දිනය |
|---|---|---|
| | | |

| ඉංග්‍රීසි විෂයයට අදාළව ලබා ඇති උසස්ම සහතිකය | නිකුත්කළ ආයතනය හා වලංගු දිනය | ශ්‍රේණිය |
|---|---|---|
| | | |

(vi) පළපුරුද්ද හා සේවා විස්තර (කලින් දරන ලද තනතුරු හා එම තනතුරු දරූ කාල පරිච්ඡේදයන් දින වකවානු සහිතව සඳහන් කරන්න)

| සේවා ස්ථානය | තනතුර | ස්ථිර ද/ තාවකාලික ද | සිට | දක්වා |
|---|---|---|---|---|
| | | | | |

06.
6.1 කිසියම් වරදකට උසාවියකදී ඔබ වරදකරුවෙකු වශයෙන් තීරණය කර තිබේ ද? :————.
(එසේ නම් විස්තර සඳහන් කරන්න)
6.2 දැනට ඔබට විරුද්ධව දෙපාර්තමේන්තුමය, විනයානුකූල පරීක්ෂණයක් පවත්වන්නේ ද? නැතහොත් අධිකරණය ඉදිරියේ නඩුවක් විභාග වෙමින් පවතී ද? (එසේ නම් විස්තර සඳහන් කරන්න.) :————.
6.3 මෙම ඉල්ලුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති සියලුම තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි දී ඇති තොරතුරු කිසිවක් අසත්‍ය හෝ සාවද්‍ය බව අනාවරණය වුවහොත් ඒ මත මා මෙම තනතුර ලැබීමට නුසුදුස්සකු බවට තීරණය කරන බවත්, උසස්වීම ලැබීමෙන් පසු මෙහි සඳහන් තොරතුරු කිසිවක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව අනාවරණය වුවහොත් මා කිසිම වන්දියක් නොලබා තනතුරින් පහකිරීමට යටත් වන බවත් දනිමි.

........................
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

.................................... ගේ ඉල්ලුම්පත ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම ආයතනයේ .................................. වශයෙන් සේවය කරන බව/සේවය කර ............................................ දින විශ්‍රාම ලබා ඇති බව ද දන්වමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව.

දිනය :————.
ආයතනය :————.

05-538

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**රාජසන්තක කරන ලද මෝටර් වාහන විකිණීම**

මහාධිකරණය, අනුරාධපුර

මෙම අධිකරණ කලාපයට අයත් අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද පහත මෝටර් වාහන විකිණීම සඳහා ලංසු කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *අධිකරණය* | *නඩු අංකය* | *වාහනය* | *ටෙන්ඩර් ඇප තැන්පත්* | |
|---|---|---|---|---|---|
| | | | | *ආපසු ගෙවන* | *ආපසු නොගෙවන* |
| 01 | අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණය | 88017 | NCYT 9281 ත්‍රීරෝද රථය | 5,000.00 | 200.00 |
| 02 | අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණය | 47678 | NCPV 7926 ඩිමෝ බට්ටා ලොරි රථය | 5,000.00 | 200.00 |
| 03. | අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණය | 45542 | HOKUETSU වර්ගයේ කොම්පෂර් යන්ත්‍රය | 2,000.00 | 200.00 |
| 04. | අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණය | 39685 | D 4 E වර්ගයේ කැටපිලර් යන්ත්‍රය | 10,000.00 | 200.00 |

01. 2018 මැයි 21 වෙනි දින සිට 2018 ජුනි 06 වෙනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ඉහත සඳහන් වාහන පරික්ෂා කර බැලිය හැකිය.

02. එක් එක් වාහනය සඳහා ඉහත දැක්වෙන පරිදි ආපසු නොගෙවන තැන්පත් මුදලක් අනුරාධපුර මහාධිකරණය වෙත ගෙවා ලදුපත් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කර ලංසු ආකෘති පත්‍ර 2018 මැයි 21 වෙනි දින සිට 2018 ජුනි 06 වෙනි දින දක්වා පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ ලබා ගත හැකි අතර එම කාලය තුළ දී ආපසු ගෙවන තැන්පත් මුදල අනුරාධපුර මහාධිකරණය වෙත ගෙවා ලබා ගන්නා ලදු පත ලංසු අයදුම්පතට ඇමිණිය යුතුය.

03. එක් එක් වාහනය සඳහා වෙන වෙනම ලංසු ඉදිරිපත් කළ යුතු අතර ලංසු කොන්දේසි පරිදි සම්පූර්ණ කොට මුද්‍රා තබන ලද ලංසු මුල් පිටපත හා අනුපිටපත යනුවෙන් සඳහන් කර එම කවර දෙකම එක් කවරයක බහා මුද්‍රා තැබිය යුතුය. එම මුල් කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''මෝටර් වාහන සඳහා මිල ගණන්'' ලෙස ද වාහනයේ අංකය ද සඳහන් කර 2018 ජුනි 07 වෙනි දින පෙ.ව. 11.00 ට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ නැතහොත් ඒ සඳහා මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

සභාපති,
මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව,
මහාධිකරණය,
අනුරාධපුර.

04. එදිනම පෙ.ව. 11.30 ට ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන අතර එම අවස්ථාවේදී ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයෙකුට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

මහාධිකරණ විනිසුරු,
අනුරාධපුරය.

2018 මැයි 03 වෙනි දින,
අනුරාධපුර මහාධිකරණයේ දී ය.

05-558

---

**ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව**

ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

පාවිච්චි කළ භාණ්ඩ විකිණීම සඳහා ලංසු කැඳවීම

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අයත් ප්‍රයෝජනයට ගත නොහැකි යැයි නිර්දේශ කොට ඇති පහත සඳහන් භාණ්ඩ විකිණීමට ලංසු කැඳවනු ලැබේ.

02. වෙන්දේසියට අදාළ භාණ්ඩ ලැයිස්තුව හා භාණ්ඩ පරීක්ෂා කර බැලීම කිරීම 2018 ජුනි මස 01 වැනි දින ප. ව. 3.00 තෙක් කාර්යාල වේලාවන්හි දී ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (ප්‍රසම්පාදන හා සැපයීම්), ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පාලන) ගේ අධීක්ෂණය යටතේ සිදු කළ හැකි ය.

03. ලංසු ඉදිරිපත් කිරීම සඳහා අදාළ ලංසු පත්‍ර කොළඹ 05, බර්නාඩ් සොයිසා මාවතේ, අංක 150 පිහිටි සර්වේයර් ජනරාල් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (ප්‍රසම්පාදන හා සැපයීම්) වෙතින් ලබාගත හැක.

04. එක් එක් අයිතම (තොග - Lot) සඳහා වෙන වෙන ම සකස් කළ ලංසු පත්‍ර කවරයක බහා මුද්‍රා තබා කවරයේ ඉහළ වම් කෙළවරේ ''අයිතම අංක ...... '' යන්න සඳහන් කර එක එක් අයිතමය වෙනුවෙන් ආපසු ගෙවනු ලබන රුපියල් දහස (රු. 1,000.00) ක තැන්පත් මුදලක් ලංසු සුරක්ෂණය වශයෙන් මෙම කාර්යාලයේ සරප් නිලධාරි වෙත 2018 ජුනි මස 08 වැනි දින පෙ. ව. 10.00 ට පෙර ගෙවා ලබා ගන්නා ලද රිසිට්පතෙහි පිටපතක් අමුණා රිසිට්පත් අංකය ලංසු පත්‍රයේ සඳහන් කර පහත සඳහන් ලංසු භාර ගැනීම අවසන් කරන වේලාවට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ ඉහත ලිපිනයට එවිය හැකි වන අතර නැතහොත් ප්‍රසම්පාදන හා සැපයීම් අංශයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලිය හැකිය.

05. භාණ්ඩ විකිණීමේ දී ඉදිරිපත් කරන ලංසුවේ වටිනාකමට අමතරව එදිනට පවතින වැට් බද්ද ගැනුම්කරු විසින් ගෙවිය යුතු ය.

06. ලංසු භාර ගැනීම 2018 ජුනි මස 08 වැනි දින ප. ව. 2.00 ට අවසන් කරන අතර එදිනම ප. ව. 2.05 ට ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරුට සහ/හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගි විය හැක.

07. ප්‍රමාද වී ලැබෙන හෝ අසම්පූර්ණ ලෙස ඉදිරිපත් කර ඇති ලංසු ප්‍රතික්ෂේප කරනු ලබන අතර මෙම විකිණීම හා සබැඳි කරුණු පිළිබඳව සර්වේයර් ජනරාල් විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වේ.

**විකිණීමට යෝජිත භාවිතා කරන ලද භාණ්ඩ වර්ග**

1. මැනුම් උපකරණ සහ ඇඳීම් උපකරණ
2. පරිගණක උපාංග
3. මුද්‍රණ යන්ත්‍ර සහ Plotters
4. ලී භාණ්ඩ
5. වානේ ගෘහ භාණ්ඩ
6. පරිගණක පුටු
7. ඡායාපිටපත් යන්ත්‍ර සහ වායුසමීකරණ යන්ත්‍ර
8. විදුලි උපකරණ
9. ටයර් සහ වාහනවලින් ඉවත් කළ කොටස්
10. වෙනත් අබලි භාණ්ඩ.

සර්වේයර් ජනරාල්,
සර්වේයර් ජනරාල් කාර්යාලය.

2018 මැයි මස 18 වැනි දින.
අංක 150, බර්නාඩ් සොයිසා මාවත,
කොළඹ 05.
දුරකතන අංක 0112 - 368106, 0112 - 369014, 0112 - 369011 - දිගුව 248
ෆැක්ස් අංකය : 0112 - 368106

---

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - ගල්කිස්ස**

ප්‍රසිද්ධ නඩු භාණ්ඩ වෙන්දේසිය - 2018/2

ගල්කිස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොකියන ලද වෙන්දේසි කිරීමට නියම කරන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2018.06.02 වැනි සෙනසුරාද දින පෙ. ව. 10.00 ගල්කිස්ස මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී වෙන්දේසියේ විකුණනු ලැබේ.

ලේඛනයෙහි සඳහන් නඩු භාණ්ඩ අධිකරණයේ රෙජිස්ට්‍රාර් වරියගේ අවසරය මත එදින වෙන්දේසිය ආරම්භ වීමට පැය භාගයකට ප්‍රථම ගැනුම්කරුවන්ට පරීක්ෂා කළ හැකි ය.

අධිකරණය විසින් නියම කරනු ලබන ලන්සුව පිළිනොගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි අදාළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු ය.

වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර ම සියලුම ගෙවීම් මුදලින් පමණක් සිදු කළ යුතු ය.

මෙහි උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් පිළිබඳ හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

ගැණුම්කරුවන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු වේ.

එම්. එම්. එම්. මිහාල්,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
ගල්කිස්ස.

2018 අප්‍රේල් මස 26 වැනි දින,
ගල්කිස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි භාණ්ඩ විස්තරය - 2018/02**

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 01. | අංක රහිත | ඇලුමිනියම් බාර් 27 |
| 02. | අංක රහිත | වාහන ජැක් 01 |
| 03. | අංක රහිත | ඇලුමිනියම් තහඩු රෝල් 02 |
| 04. | අංක රහිත | ඇලුමිනියම් භාජන 06 |
| 05. | අංක රහිත | පරණ කාර් සෙට් 10 |
| 06. | අංක රහිත | අබලන් ස්පීකර් 09 |
| 07. | අංක රහිත | අබලන් වී සී ඩී ප්ලේයර් 01 |
| 08. | අංක රහිත | වතුර මෝටර 03 |
| 09. | අංක රහිත | සිවිලින් ෆෑන් මෝටර 01 |
| 10. | අංක රහිත | සිවිලින් ෆෑන් තටු 09 |
| 11. | අංක රහිත | ටයිල් කටර් 01 |
| 12. | අංක රහිත | ඩ්‍රිල් 02 |
| 13. | අංක රහිත | වයර් කොටස් හා මීටර කොටස් ප්‍රමාණයක් |
| 14. | අංක රහිත | බ්ලෙන්ඩර් කොටස් කීපයක් |
| 15. | අංක රහිත | විවිධ දෙර ලොක් හා යතුරු ප්‍රමාණයක් |
| 16. | අංක රහිත | තරාදි 01 |
| 17. | අංක රහිත | වාහන පැති කණ්නාඩි 06 |
| 18. | අංක රහිත | වාහන විදුලි පහන් 05 |
| 19. | අංක රහිත | කිමිදුම් උපකරණ කට්ටලය |
| 20. | අංක රහිත | ගමන් බෑග් 01 |
| 21. | අංක රහිත | පාපැදි රෝද 02 |
| 22. | අංක රහිත | ත්‍රී රෝද රථ ටයර් 01 |
| 23. | අංක රහිත | දම්වැල සහිත බොලොක්ක 01 |
| 24. | අංක රහිත | ඉනිමං 03 |
| 25. | අංක රහිත | මහන මැෂින් 01 |
| 26. | අංක රහිත | දුණු තල කොටස් 05 |
| 27. | අංක රහිත | ව්‍යායාම උපකරණ බාර් 08 |
| 28. | 83974 | විවිධ ප්‍රමාණයේ කම්බි කුරු මිටිය |
| 29. | 64880 | අමානෝ තහඩු 03 |
| 30. | 73930 | යකඩ කපන මැෂින් 01 |
| 31. | 51514 | සින්ක් 01 |
| 32. | 82487 | යකඩ කපන මැෂින් 01 |
| 33. | 86675 | ග්‍රයින්ඩර් 01 |
| 34. | 86675 | ඩ්‍රිල් මැෂින් 01 |
| 35. | 80324 | ගෑස් සිලින්ඩර් 01 |
| 36. | 50142 | වී සී ඩී ප්ලේයර් 01 |
| 37. | 50810 | වතුර මෝටර 01 |
| 38. | 82183 | ප්‍රයි ෆෑන් පෙට්ටි 02 |
| 39. | 80501 | රූපවාහිනී 01 |
| 40. | 49082 | ප්ලාස්ටික් පුටු 06 |
| 41. | 66925 | සාස්පාන් 01 |
| 42. | 66925 | යකඩ බට 11 |
| 43. | 12213/S | සෙල්ලම් කාර් 01 |
| 44. | 12203/S | විදුලි පන්දම් 01 |
| 45. | 73664 | කොළ පාට ත්‍රී රෝද රථය (ලියාපදිංචි කළ හැක) |
| 46. | බී/130/13 | 16 - 1986 ත්‍රීරෝද රථය (කොටස් කර විකිණීමට) |
| 47. | 62783 | 204 - 8696 ත්‍රී රෝද රථය (කොටස් කර විකිණීමට) |
| 48. | ඒ 296/15 | WP QP 9581 ත්‍රී රෝද රථය (කොටස් කර විකිණීමට) |
| 49. | 70419 | 14-1988 ත්‍රීරෝද රථය (කොටස් කර විකිණීමට) |
| 50. | 81603 | WP AAE 0873 ත්‍රීරෝද රථය (ලියාපදිංචි කළ හැක) |
| 51. | 93279 | WP HS 0542 ත්‍රීරෝද රථය (ලියාපදිංචි කළ හැක) |
| 52. | 80067 | 204 - 5049 ත්‍රීරෝද රථය (කොටස් කර විකිණීමට) |
| 53. | 83247 | WP AAC 5734 ත්‍රීරෝද රථය (ලියාපදිංචි කළ හැක) |
| 54. | අංක රහිත | 21-9952 ත්‍රීරෝද රථය (කොටස් කර විකිණීමට) |
| 55. | 50376 | 201-1046 ත්‍රීරෝද රථය (කොටස් කර විකිණීමට) |
| 56. | අංක රහිත | 21 - 9821 ත්‍රීරෝද රථය (කොටස් කර විකිණීමට) |
| 57. | අංක රහිත | WP TX 7852 යතුරු පැදිය (කොටස් කර විකිණීමට) |
| 58. | අංක රහිත | WP HE 9868 යතුරු පැදිය (කොටස් කර විකිණීමට) |
| 59. | අංක රහිත | WP UX 5303 යතුරු පැදිය (කොටස් කර විකිණීමට) |
| 60. | අංක රහිත | WP HL 1247 යතුරු පැදිය (කොටස් කර විකිණීමට) |
| 61. | 85766 | WP HC 0702 යතුරු පැදිය (ලියාපදිංචි කළ හැක) |
| 62. | B1485/09 | WP TC 2418 යතුරු පැදිය (කොටස් කර විකිණීමට) |
| 63. | B81/T/15 | WP BAZ 5911 යතුරු පැදිය (ලියාපදිංචි කළ හැක) |
| 64. | B2131/11 | බෆල් දෙකක් හා ඊට අදාළ උපාංග |
| 65. | අංක රහිත | විවිධ ප්‍රමාණයේ අබලි යකඩ බට ප්‍රමාණයක් |
| 66. | අංක රහිත | විවිධ ප්‍රමාණයේ අබලි කම්බි කුරු ප්‍රමාණයක් |
| 67. | අංක රහිත | විවිධ අබලි යකඩ කොටස් තොගයක් |
| 68. | අංක රහිත | අබලි ඇලුමිනියම් හා යකඩ තහඩු ප්‍රමාණයක් |
| 69. | අංක රහිත | අබලි ඇලුමිනියම් බාර් හා කොටස් ප්‍රමාණයක් |
| 70. | අංක රහිත | ත්‍රීරෝද රථ අබලි කොටස් තොගයක් |
| 71. | අංක රහිත | වාහන ටයර් 04 |
| 72. | අංක රහිත | ඩිෆරන්සල් කොටස් 20 |
| 73. | අංක රහිත | අබලි ඔක්සිජන් බෝතල් 02 |
| 74. | අංක රහිත | අබලි යකඩ ප්ලේට් 09 |
| 75. | අංක රහිත | අබලි ට්‍රැක්ටර් ටේලර් කොටස් 01 |
| 76. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 77. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 78. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 79. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 80. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 81. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 82. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 83. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 84. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 85. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 86. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 87. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 88. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 89. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 90. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 91. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 92. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 93. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 94. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 95. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 96. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 97. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 98. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 99. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 100. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 101. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 102. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 103. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 104. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 105. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 106. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 107. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 108. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 109. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 110. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 111. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 112. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 113. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 114. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 115. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 116. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 117. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 118. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 119. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 120. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 121. | ඒ 1579/17 | ජංගම දුරකථන 01 |
| 122. | 63139 | ජංගම දුරකථන 01 |
| 123. | 63584 | ජංගම දුරකථන 01 |
| 124. | 64806 | ජංගම දුරකථන 01 |
| 125. | 50142 | ජංගම දුරකථන 01 |

05-461

# රජයේ නොවන දැන්වීම්

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ඇක්‍යුමෙක් කෝපරේට් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 130671
ලියාපදිංචි කළ දිනය : 2018 මාර්තු 13
ලියාපදිංචි කාර්යාලය : අංක 81, ඉසිපතන මාවත, කොළඹ 05

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

පී. ඩී. එස්. රුවන්පුර,
සමාගම් ලේකම්.

05-455

### නිවේදනයයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කිරීම පිළිබඳව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මෙසේ නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : වෙබ් මීඩියා සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 104847
ලියාපදිංචි ලිපිනය : අංක 551/28, එක්සත් මාවත, ඉහළකරගහමුණ, කඩවත

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. එම්. ඩී. එස්. අලහකෝන්,
ලේකම්.

2018 අප්‍රේල් මස 18 වැනි දින.

05-459

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ඔක්සි ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 131790
ලියාපදිංචි ලිපිනය : අංක 70/1, මැදවැලිකඩ පාර, රාජගිරිය
සංස්ථාගත කළ දිනය : 2018.04.23

සමාගමේ ලේකම්.

05-460

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වත්තල, හැඳල, කොන්වන්ට් පාරේ අංක 70/1/D දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 603481453 V හිමි ගුණරත්න ගුණසිරි ද සොයිසා වන මම, ප්‍රසිද්ධ නොතාරිස් ඉරංග විජය ගුණවර්ධන විසින් ලියා සහතික කරන ලද 2016.11.11 දිනැති අංක 199 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය (රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ බස්නාහිර කලාප කාර්යාලය දෙල්කඳ නුගේගොඩ හි අංක 192 කාණ්ඩයේ 31 වන පත් ඉරුවේ අංක 6810 දරන දිනපොත් අංක යටතේ ලියාපදිංචි කරන ලද) මගින් මත්තේගොඩ, කුඩාමාදුව, සිසිල් සෙවන උයනේ අංක 8/බී/1 දරන ස්ථානය හි පදිංචි ශ්‍රී ලංකා ජාතික හැඳුනුම්පත් අංක 581070284 V හිමි ලේකම්වසම් හික්කඩුව ලියනගේ දුමින්ද ජගත් ද සිල්වා යන අයව මාගේ ඇටෝර්නි බලකරු ලෙස පත් කරන ලද ඇටෝර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කරන ලද බව හා බල රහිත කරන ලද බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

ගුණරත්න ගුණසිරි ද සොයිසා.

2018 අප්‍රේල් මස 18 වැනි දින.

05-464

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) දරන ඡේදය යටතේ සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳ දැන්වීම

සමාගමේ නම : සෙන්පති ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 130165
සංස්ථාගත කළ දිනය : 2018.02.23
ලියාපදිංචි ලිපිනය : අංක 765/154, පුංචි වැල්ලන්ගිරිය, හොකන්දර දකුණ, හොකන්දර.

05-465

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) දරන ඡේදය යටතේ සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳ දැන්වීම

සමාගමේ නම : වී කේ බී ඉංජිනියරිං කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 67224
සංස්ථාගත කළ දිනය : 2009.03.06
ලියාපදිංචි ලිපිනය : අංක 3/4, පින්නවත්ත පාර, දෙහිවල.

05-466

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) දරන ඡේදය යටතේ සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳ දැන්වීම

සමාගමේ නම : සකුන්තලාස් හොටෙල් ඇන්ඩ් රෙස්ටුරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 130249
සංස්ථාගත කළ දිනය : 2018.02.27
ලියාපදිංචි ලිපිනය : අංක 181/1, හේකිත්ත පාර, වත්තල.

05-467

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම : හයි බ්‍රිටිෂ් ඉන්ග්ලිෂ් ඇකඩමි (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 131343,
සංස්ථාගත කළ දිනය : 2018.04.02
ලියාපදිංචි ලිපිනය : බී 106, ගොඩවෙල, දන්නෝවිට.

ලේකම්.

05-485

### සමාගම් නාමය වෙනස් කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 8 වගන්තියට අනුකූලව, එස් සී සී සී ගෝල් සිමෙන්ට් ටර්මිනල් (ප්‍රයිවට්) ලිමිටඩ් හි නාමය ඉන්සි ඉකෝසයිකල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ලෙස 2018 අප්‍රේල් මස 25 වැනි දින සිට බලපවත්වන පරිදි වෙනස් කොට ඇති බව ඉහත පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පැවති නාමය : එස් සී සී සී ගෝල් සිමෙන්ට් ටර්මිනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 7562
ලියාපදිංචි කාර්යාලය : 413, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 03
සමාගමේ අලුත් නාමය : ඉන්සි ඉකෝසයිකල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

ඉන්සි ඉකෝසයිකල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

05-486

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2018 අප්‍රේල් මස 06 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ඉසෙඩ් එක්ස් වයි හොං කොං කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 131525
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 50/ඒ, ගාලු පාර, කොළඹ 06

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

05-491

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2017 අප්‍රේල් මස 23 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ජී ටී එස් හොලිඩේස් (පීවීටී) එල්ටීඩී
සමාගම් අංකය : පී වී 131660
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 128, පොල්හේන, මඩපාත, පිළියන්දල

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

05-492

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

අංක 348/14, තුන්වන පටුමග, වීරසිංහ පිරිවෙන පාර, කිරිල්ලවල, වැබොඩ හි ජාතික හැඳුනුම්පත් අංක 800625335 V හිමි කුමාරපතිරගේ දොන් සුමුදු දර්ශන ඩයස් කරුණාරත්න වන මම කදාන ප්‍රසිද්ධ නොතාරිස් ජී. ප්‍රාර්ථනා ගංගානි ධර්මරත්න වර්ෂ 2015ක් වූ ජූනි මස 04 වැනි දින ලියා සහතික කරන ලද අංක 44 දරන බත්තරමුල්ල රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය මගින් අංක 40, කිරිමැටියාගාර කඩවත හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 840021025 V හිමි සනත් ජයශාන්ත විසිදාගම යන අය වෙත පවරන ලද ඇටෝර්නි බලය මෙම දැන්වීමේ දින සිට බල පැවැත්වෙන පරිදි මින් අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලංකාවාසී සියලුදෙනා හට මින් දැනුම් දෙමි.

කේ. ඩී. එස්. ඩී. ඩයස් කරුණාරත්න.

05-502

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

අංක 348/14, තුන්වන පටුමග, වීරසිංහ පිරිවෙන පාර, කිරිල්ලවල, වැබොඩ හි ජාතික හැඳුනුම්පත් අංක 800625335 V හිමි කුමාරපතිරගේ දෙන් සුමුදු දර්ශන ඩයස් කරුණාරත්න වන මම කදාන ප්‍රසිද්ධ නොතාරිස් ජී. ප්‍රාර්ථනා ගංගානි ධර්මරත්න වර්ෂ 2015ක් වූ ජූනි මස 04 වැනි දින ලියා සහතික කරන ලද අංක 45 දරන බත්තරමුල්ල රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය මගින් අංක 40, කිරිමැටියාගාර කඩවත හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 840021025 V හිමි සනත් ජයශාන්ත විසිදාගම යන අය වෙත පවරන ලද ඇටෝර්නි බලය මෙම දැන්වීමේ දින සිට බල පැවැත්වෙන පරිදි මින් අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලංකාවාසී සියලුදෙනා හට මින් දැනුම් දෙමි.

කේ. ඩී. එස්. ඩී. ඩයස් කරුණාරත්න.

05-503

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ජාඇල බටගම උතුර අංක 210 පදිංචි වලවේ කිරින්ගොඩගේ සමන්ත වීරසූරිය NIC No. 820690451) වන මා වසින් ජාඇල උතුර බටගම අංක 21/සී හි පදිංචි කංකානම්ගේ අනෝමා ප්‍රියදර්ශනී NIC No. 817904815) යන අය වෙනුවෙන් ජර්මනියේ බෙන්ෂයින් පදිංචි ඇලෙක්සැන්ඩර පුන්බෝහිම් ALEXANDER PHUMBOHM) විසින් 2016.10.21 වැනි දින ලියා සහතික කරන ලද හා බත්තරමුල්ල රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ දිනපොත් අංක 15290 අග 123 පිටුවේ වෙලුම් අංක 181 හා 2016.11.11 දින ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය බල රහිත කොට අවලංගු කරන බව මින් ප්‍රකාශ කරන අතර, මින් පසු ඔහු විසින් සිදු කරනු ලබන කිසිම ක්‍රියාවකට, බලයකට ඔප්පුවකට හෝ නඩුවකට හෝ කරුණකට ඔහු වෙනුවෙන් මා වග නොකියන බව ද ප්‍රකාශ කර සිටිමි.

වලවේ කිරින්ගොඩගේ සමන්ත වීරසූරිය.

05-518

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල, මීපිටිය, ශ්‍රීමත් එඩ්වින් විජයරත්න මාවත, අංක 25/5 හි පදිංචි බටුවනගේ සුරංග සංජීව තිලකසිරි වන මා විසින් නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් එල්. ඒ. බන්දුල සමරසේකර මහතා විසින් ලියා සහතික කළ අංක 841 හා 2014.12.18 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය මගින් කෑගල්ල, මීපිටිය, ශ්‍රීමත් එඩ්වින් විජයරත්න මාවත, අංක 25/5 හි පදිංචි බටුවනගේ සමන් තිලකසිරි (ජා. හැ. අ. 500622660V) යන අයට බලය පවරන ලදී.

වර්ෂ 2018ක් වූ මැයි මස 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි එකී ඇටෝර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරනු ලැබේ.

තවද, එකී ඇටෝර්නි බලකරු වන බටුවනගේ සමන් තිලකසිරි යන අය විසින් මින් ඉදිරියට මගේ ඇටෝර්නි බලකරු වශයෙන් සිදු කරනු ලබන කිසිම කටයුත්තකට මා විසින් වගකියනු නොලැබේ.

බටුවනගේ සුරංග සංජීව තිලකසිරි,
ඇටෝර්නි අධිපති.

05-521

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල, කරපනේ හි පදිංචි අරුල්ප්‍රගාශන් ජේසුදසන් වන මා විසින් නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ඒ. මැල්කම් මවාඩෝ මහතා විසින් ලියා සහතික කළ අංක 1077 හා 2011.06.01 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් කෑගල්ල, හෙට්ටිමුල්ල, ගොඩගන්තැන්න, තලේවෙල හි පදිංචි හෙට්ටිආරච්චිල්ලාගේ උදය ජයවීර (ජා. හැ. අං. 832701874 V) යන අයට පවරන ලදී.

වර්ෂ 2018ක් වූ ජනවාරි මස 09 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරනු ලැබේ.

තවද, එකී ඇටෝර්නි බලකරු වන හෙට්ටිආරච්චිල්ලාගේ උදය ජයවීර යන අය විසින් මින් ඉදිරියට මගේ ඇටෝර්නි බලකරු වශයෙන් සිදු කරනු ලබන කිසිම කටයුත්තකට මා විසින් වගකියනු නොලැබේ.

අරුල්ප්‍රගාශන් ජේසුදසන්,
ඇටෝර්නි අධිපති.

05-522

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

එන්එස්ඩබ්ලිව් 2767, ඩූන්සයිඩ්, පවර් ස්ට්‍රීට්, අංක 88 A හි පදිංචිව සිට දැනට පොල්ගස්ඕවිට, හෙරලියාවල, අංක 18/1 හි පදිංචිව සිටින වර්ණකුලසූරිය තොම්මගේ තොෂානි නන්දිකා ප්‍රනාන්දු වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලුම සාමාජිකයින් වෙත දන්වා සිටින වගනම්, තඹරවිල,වෛයික්කාල්, තැපැල්වසම හි පදිංචි වර්ණකුලසූරිය තොම්මගේ ජෝෂප් ෂෙල්ටන් ප්‍රනාන්දු යන අයට වර්ෂ 2003 පෙබරවාරි මස 03 වැනි දින ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. ජී. හේරත් තැන ලියා සහතික කළ අංක 1071 දරන ඇටර්නි බලපත්‍රය මගින් පත්කර එකී නොතාරිස් තැන ඉදිරියේ අත්සන් කර, ලිඛිත බලධාරිකම් හා ඇටෝර්නි බලපත්‍ර පොතේ 225 කාණ්ඩයේ 127 පත් ඉරුවේ, 5184 දින පොත් අංකය යටතේ ලියාපදිංචි කර ඇති ඇටර්නි බලපත්‍රය වහා ක්‍රියාත්මක වන පරිදි අවලංගු සහ බලරහිත වන බව ද, ඔහු විසින් ඇතුළත් වනු ලබන කිසිදු ගනුනදෙනුවක බලපැවැත්මක් නොමැති බව ද, මෙයින් දැනුම් දෙනු ලැබේ.

වර්ණකුලසූරිය තොම්මගේ තොෂානි
නන්දිකා ප්‍රනාන්දු,
ඇටෝර්නි දීමනාකරු.

05-543

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වන ඡේදයට අනුව 2011.02.23 වැනි දින ජෙනිසිස් මාර්කටිං පුද්ගලික සමාගම ලියාපදිංචි කළ බව මෙයින් දන්වමු.

සමාගමේ නම : ජෙනිසිස් මාර්කටිං පුද්ගලික සමාගම
සමාගමේ අංකය : පී වී 77365
ලියාපදිංචි ලිපිනය : අංක 33 ඒ, මැල්බන් එවෙනියු, කොළඹ 04

ඇස්. ලෝකනාතන්,
ලේකම්.

අංක 2 සී, හිල්ඩා පටුමග,
දෙහිවල.

05-544

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### සෙලාන් බැංකුව පී.එල්.සී. - පිටකොටුව ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපල කොළඹ 12 පදිංචි (දැන් මාබෝල) සෙයියදු ඊබ්‍රහිම් සයිබු අපීර් සහ අපීර් මොහොමඩ් රිමාස් යන අය බන්ධනදායින් වශයෙන් සෙලාන් බැංකුව පී.එල්.සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කෙරගපොකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ සහ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභාවේ වැලිසර උප කාර්යාලය තුළ කෙරගේ - පොකුණ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. රාසප්පා විසින් සාදන ලද අංක 381/2013 සැලැස්මේ නිරූපනය වන (බලයලත් මිනින්දෝරු ආර්. කනගරත්නම් විසින් සාදන ලද 1995.08.09 දිනැති අංක 6486 සැලැස්මේ සඳහන් ලොට්ස් 1බී 2 සහ 1බී 3 ලෙස නිරූපනය වන ඉඩමේ එකතු කිරීමක් වන) ජෝර්ජ් මාවත, දැන් වරිපනම් අංක 72 දරන දවටගහකුඹුර නමැති ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සහිත ඉඩමේ ලොට් එක්ස් ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් අටක් (අ.0, රූ.0, පර්.8) විශාල ඉඩම, පහත සඳහන් පරිදි මාර්ග අයිතිය සමග.

පෙර කී කෙරගේ - පොකුණ ගමේ පිහිටි එකී අංක 6486 මිනුම් සැලැස්මේ නිරූපණය වන දවටගහකුඹුර නමැති ඉඩමේ ලොට් 1බී 5 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් දෙකයි දශම හතයි හයක් (අ.0, රූ.0, පර්.02.76) විශාල ඉඩම.

ඉහත සඳහන් දේපල 2018 ජූනි මස 08 වැනි දින පෙරවරු 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.*- කොළඹ - මීගමුව මාර්ගයේ පිහිටි හැඳල මංසන්ධියේ සිට ජාඇල දෙසට කි.මී. 2.4 ක පමණ දුරක් ගොස් දකුණු පසින් ඇති ජෝර්ජ් මාවතට හැරෙන්න. එම ජෝර්ජ් මාවත ඔස්සේ තවත් මීටර 350 ක පමණ දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ දකුණුපසින් මෙම මාර්ගයට මුහුණලා පිහිටා ඇත.

යෝජනා සම්මුතිය දැන්වීම.- රජයේ ගැසට් පත්‍රයේ 2018.04.06 වැනි දින පළවී ඇති අතර, ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2018.03.30 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2018.03.26 වැනි දින පළවී ඇත.

ගෙවීමේ ක්‍රමය .- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3.

වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්) 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500/-, 6. සියලුම ප්‍රචාරක වියදම්, ගැණුම් මිලෙන් ඉතිරි 90% විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකල යුතුය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10%ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත."

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.- ප්‍රධාන කළමණාකාරිණිය (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03 දුරකථන අංක : 011 2456480, 2456481.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකතන අංක : 011 3068185, 011 2572940

05-506

---

**සෙලාන් බැංකුව පී.එල්.සී. - ජාඇල ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපල ජාඇල පදිංචි මහපටබැඳිගේ රෙජී දයාන් පෙරේරා සහ කන්නන්ගර ආරච්චිගේ ඇන් ප්‍රමිතා පෙරේරා යන අය බන්ධනදයින් වශයෙන් සෙලාන් බැංකුව පී.එල්.සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

**1 වන වෙන්දේසිය.-**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජාඇල නගර සභා සීමාව තුළ කල්එළිය පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ටී. පෙරේරා විසින් සාදන ලද 2010.09.11 දිනැති අංක 7763 දරන සැලැස්මේ නිරූපනය වන සාන්ත තෙරේසා මාවත දකුණ, වරිපනම් අංක 34ඒ දරන කහටගහවත්ත නමැති ඉඩමේ ලොට් කිව් ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් නවයයි දශම පහයි හතක් (අ.0, රූ.0, පර්.9.57) විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපල 2018 ජුනි මස 12 වැනි දින පෙරවරු 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපලට පිවිසීම.- ජාඇල නගර මධ්‍යයේ සිට කොළඹ - පුත්තලම ප්‍රධාන මාර්ගය ඔස්සේ කොළඹ දෙසට කි.මී. 2 ක පමණ දුරක් ගිය විට ඇති කපුවත්ත මංසන්ධිය දක්වා පැමිණ (13 වන කි.මී. කණුව අසලින්) දකුණපසට ඇති කල්එළිය පාරට හැරී තවත් මීටර් 650 ක පමණ දුරක් ගොස් දකුණු පසට පිහිටි සාන්ත තෙරේසා මාවතට හැරී මීටර් 50 ක පමණ දුරක් ඉදිරියට ගිය විට අංක 34 ඒ දරන අදළ දේපළ මාර්ගයේ දකුණුපසින් පිහිටා ඇත.

**2 වන වෙන්දේසිය.-**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජාඇල නගර සභා සීමාව තුළ ජාඇල ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසයේ අංක 189 වැවල ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ කල්එළිය පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ටී. පෙරේරා විසින් සාදන ලද 2006.09.02 දිනැති අංක 6181 දරන සැලැස්මේ නිරූපනය වන සාන්ත තෙරේසා මාවත වරිපනම් අංක 32 සහ 32ඒ දරන කහටගහවත්ත නමැති ඉඩමේ ලොට් එක්ස් ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් දාහතයි දශම හතයි පහක් (අ.0, රූ.0, පර්.17.75) විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

පෙර කී අංක 6181 සැලැස්මේ සඳහන් ලොට් වයි ලකුණු කළ මාර්ගය සඳහා වෙන් කිරීම තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග.

ඉහත සඳහන් දේපල 2018 ජුනි මස 12 වැනි දින පෙරවරු 11.00 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපලට පිවිසීම.- ජාඇල නගර මධ්‍යයේ සිට කොළඹ - පුත්තලම ප්‍රධාන මාර්ගය ඔස්සේ කොළඹ දෙසට කි.මී. 2 ක පමණ දුරක් ගිය විට ඇති කපුවත්ත මංසන්ධිය දක්වා පැමිණ (13 වන කි.මී. කණුව අසලින්) දකුණපසට ඇති කල්එළිය පාරට හැරී තවත් මීටර් 650 ක පමණ දුරක් ගොස් දකුණු පසට පිහිටි සාන්ත තෙරේසා මාවතට හැරී මීටර් 50 ක පමණ දුරක් ඉදිරියට ගිය විට අදාළ දේපළ මාර්ගයේ දකුණුපසින් පිහිටා ඇත.

යෝජනා සම්මුතිය දැන්වීම.- රජයේ ගැසට් පත්‍රයේ 2018.03.29 වැනි දින පළවී ඇති අතර, ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2018.04.04 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2018.03.26 වැනි දින පළවී ඇත.

ගෙවීමේ ක්‍රමය .- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද සහ රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්) 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000/- 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500/-, 6. සියලුම ප්‍රචාරක වියදම්, ගැණුම් මිලෙන් ඉතිරි 90% විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකල යුතුය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10%ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.- ප්‍රධාන කළමණාකාරිණිය (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03 දු. ක. 011 2456475, 2456481.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකතන අංක : 011 3068185, 011 2572940

05-505

---

**ඩී එෆ් සී සී බැංකුව පීඑල්සී**
(කලින් ඩී එෆ් සී සී බැංකුව ලෙස හැඳින් වූ)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 08 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 2080/149/566, 2028, 2030 සහ 3398 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කිනිගොඩ කෝරළේ, මැද්දේ මැදිලිය පත්තුවේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට සහ ප්‍රාදේශීය සභා සීමාවට අයත් යෝධගම ග්‍රාම නිලධාරී වසමේ, ඕවත්ත ග්‍රාමයේ පිහිටි (බලයලත් මිනින්දෝරු T. N. කාදර් විසින් සාදන ලද අංක 3866/ඈ දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන ඉඩමේ කොටසක්) බලයලත් මිනින්දෝරු එස්. ආර්. පී. එල්. සේනානායක විසින් සාදන ලද 2014 ජනවාරි මස 31 වන දිනැති අංක 8486/2014/KG දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස දැක්වෙන පින්නලන්ද වත්ත ලෙස හැඳින්වෙන බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක් - 00 : රූඩ් - 00 : පර් - 19.44
එහි පිහිටි ගොඩනැගිලි, ගස් වැල් සහ සියල්ල සහිතව

මෑතක දී සිදුකරන ලද නවතම මැනීමකට අනුව ඉහත ඉඩම පහත විස්තර කරන ලද ඉඩමේ උප බෙදීමක් වේ.

ඉහත කී ඕවත්ත ග්‍රාමයේ පිහිටි බලයලත් මිනින්දෝරු T. N. කාදර් විසින් සාදන ලද අංක 3866/ඈ දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන පින්නලන්ද වත්ත ලෙස හැඳින්වෙන බිම් කට්ටය.

ඉඩමේ ප්‍රමාණය : අක් - 00 : රූඩ් - 00 : පර් - 28.9
එහි පිහිටි ගොඩනැගිලි, ගස්වැල් සහ සියල්ල සහිතව

කෑගල්ල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ඉහත කී පිඹුරුපත් අංක 8486/2014/KG යටතේ ලියාපදිංචි කර ඇත.

ප්‍රසිද්ධ නොතාරිස් S. හපුතන්ත්‍රී, B.S. අභයවික්‍රම සහ N.S. රණතුංග විසින් සහතික කරන ලද 2014 ජුනි මස 24, 2014 ජුනි මස 26 සහ 2014 ජුනි මස 30 දිනැති අංක 2080/149/566, ප්‍රසිද්ධ නොතාරිස් S. හපුතන්ත්‍රී විසින් සහතික කරන ලද 2014 මාර්තු මස 14 දිනැති අංක 2028, ප්‍රසිද්ධ නොතාරිස් S. හපුතන්ත්‍රී විසින් සහතික කරන ලද 2014 මාර්තු මස 14 දිනැති අංක 2030 සහ ප්‍රසිද්ධ නොතාරිස් C.P. රාජරත්න විසින් සහතික කරන ලද 2017 මාර්තු මස 30 දිනැති අංක 3398 දරන උකස්කරයන් ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ නීතිගත වූ සහ ලියාපදිංචි අංක PV69984 දරන එහි ලියාපදිංචි කාර්යාලය මහනුවර පිහිටි (මින්මතු සමාගම ලෙස හැඳින්වෙන) සේසුර සිල්ක් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ඩී එෆ් සී සී බැංකුව පීඑල්සී (ඩී එෆ් සී සී වර්ධන බැංකුව පී එල් සී හි අනුප්‍රාප්තික) ට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2018 ජුනි මස 05 වැනි දින (අඟහරුවාදා) පෙ.ව. 11.00 ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගෙවීමේ ක්‍රමය.- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

(01) ගැණුම් මුදලින් 10% ක් (සියයට දහයක්),
(02) පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර) සහ එම කොමිස් මුදලට අදළ සියළුම බදු,
(04) රු. 1,12,000.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
(05) ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000.00,
(06) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.00

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුව පීඑල්සී හි නීති දෙපාර්තමේන්තුව අමතන්නඃ දුරකතන අංක 011 - 2371371.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"
ඩ

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්
වසර 126 ක සේවා විශිෂ්ටත්වය සමගින්.

ප්‍රධාන කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකතන අංකය : 081 - 2227593.
දුරකතන/ෆැක්ස් අංකය : 081-2224371,
ඊමේල් : schokmankandy@sltnet.lk

නගර කාර්යාලය :
6 ඒ, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08.
දුරකතන අංක : 011-2671467, 011- 2671468.
දුරකතන/ෆැක්ස් අංකය : 011- 2671469.
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

05 - 422

---

**ඩී එෆ් සී සී බැංකුව පීඑල්සී**
(කලින් ඩී එෆ් සී සී බැංකුව ලෙස හැඳින් වූ)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 08 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 2433 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට සහ මහනුවර මහ නගර සභා සීමාවට අයත්, 259 ගැටඹේ ග්‍රාම නිලධාරී වසමේ, දොඩන්වල දෙවෙනි රාජසිංහ මාවතේ පිහිටි ප්‍රිම්රෝස් හිල් එස්ටේට් ලෙස හැඳින්වෙන (බලයලත් මිනින්දෝරු ටී. බී. සෝමදාස විසින් සාදන ලද 1981 මැයි මස 31 වන දිනැති අංක 287 දරන පිඹුරේ ලොට් අංක 7A ලෙස දැක්වෙන සහ බලයලත් මිනින්දෝරු සී. පාලමකුඹුර විසින් සාදන ලද 1990 අගෝස්තු මස 15 වන දිනැති අංක 920 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන බිම් කට්ටියන්හි ඒකාබද්ධ කිරීමක් සහ නැවත මැනීමක් වන බලයලත් මිනින්දෝරු ආර්. සී. ඕ. ද ලා මොටේ විසින් සාදන ලද 1994 ජූලි මස 30 වන දිනැති අංක 7318 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන බිම් කට්ටියෙහි නැවත මැනීමකි) බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක විසින් සාදන ලද 2015 මාර්තු මස 14 වන දිනැති අංක 69/2015 දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක් - 00 : රූඩ් - 01 : පර් - 8.50

එහි පිහිටි ගොඩනැගිලි, ගස් වැල්, පස සහ සියල්ල සහිතව ඉහත කී පිඹුරුපත් අංක 69/2015 දරන පිඹුරට අනුව

ප්‍රසිද්ධ නොතාරිස් එස්. හපුතන්ත්‍රී විසින් සහතික කරන ලද 2015 ඔක්තෝබර් මස 21 දිනැති අංක 2433 දරන උකස්කරය ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ නීතිගත වූ සහ ලියාපදිංචි අංක PV69984 දරන එහි ලියාපදිංචි කාර්යාලය මහනුවර පිහිටි (මින්මතු සමාගම ලෙස හැඳින්වෙන) සෙසුර සිල්ක් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ඩී එෆ් සී සී බැංකුව පීඑල්සී (ඩී එෆ් සී සී වර්ධන බැංකුව පී එල් සී හි අනුප්‍රාප්තික) ට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ

Prime Lending Rate + Four decimal Five Per Centum (4.5%) per annum (Floor rate of 16.5%) තවත් රුපියල් හාර කෝටි විසි හතර ලක්ෂ හතලිස් හය දහස් පන් සියයක (රු. 42,446,500) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate + Four Centum (4%) per annum (Floor rate of 16%), හා තවත් රුපියල් හය කෝටි හත් ලක්ෂයක (රු. 6,700,000) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate + Four decimal Five Per Centum (4.5%) per annum (Floor rate of 16.5%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබීඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක. 2549A, 3079, 1146 සහ 1148 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනවල මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි ඩබ්ලිව් ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩ පළාත කඳුකර පහල කෝරළේ ග්‍රැවර්ට් හතර සහ ගඟවට කෝරලේ, මහනුවර ප්‍රාදේශීය සභා සහ මහනුවර හිඳගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 267 ග්‍රාම නිළධාරි කොට්ඨාසය තුළ හිඳගල පිහිටි ''මොව්බ්‍රේ එස්ටේට් හි කොටසක්'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. ඉන්ද්‍රානි මල්ලිකා යන අය විසින් සාදන ලද 2015 මාර්තු මස 14 දාතම හා අංක 2125 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් , උතුරට : බලයලත් මානක තැන කේ.එච්. නවරත්න යන අය විසින් සාදන ලද අංක 9043 දරන පිඹුරේ ලොට් 15A, නැගෙනහිරට : අංක 9043 දරන එකී පිඹුරේ ලොට් 16A සහ 17, දකුණට : ලියනගහමහඔය සහ බස්නාහිරට : පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර තුනයි පර්චස් දහයක් (අ. 3, රූ. 0, පර්. 10)විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 2125 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිුරුව A 562/65 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. එකී හිඳගල පිහිටි ''මොව්බ්‍රේ එස්ටේට් හි කොටසක්'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. ඉන්ද්‍රානි මල්ලිකා යන අය විසින් සාදන ලද 2015 මාර්තු 14 දාතම හා අංක 2125 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙහි ලොට් 1, නැගෙනහිරට : මෙහි ලොට් 1, දකුණට : මෙහි ලොට් 3 සහ 1 සහ බස්නාහිරට : වතු යායේ පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් දොළහක් (අ. 0, රූ. 2, පර්. 12) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 2125 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිුරුව A 562/66 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන කේ.එම්.එච්. නවරත්න යන අය විසින් සාදන ලද 1990 පෙබරවාරි මස 15 සහ 11 දාතම හා අංක 9043 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 25 සහ 27 දිගේ ඒ යටින් ඒ මතින් වෙනත් සම්බන්ධ අයිතින් සහ ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමග සහ පිඹුරු අංක 2125 හි එකී ලොට් 2 හරහා ගලා බසින ඔය භාවිතා කිරීමේ අයිතියද හා සමගය.

උකස් බැඳුම්කර අංක 2549A, 3079, 1146 ප්‍රකාර හා ඒ යටතේ උකස්කොට ඇපකොට ඇත.

3. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරලේ කඩවත් සතර මහනුවර ප්‍රාදේශීය සභා සහ මහනුවර හිඳගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 267 ග්‍රාම නිළධාරි කොට්ඨාසය තුළ උඩපළාත කඳුරට පහල කෝරලේ හිඳගල පිහිටි ''මොව්බ්‍රේ එස්ටේට්'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. ඉන්ද්‍රානි මල්ලිකා යන අය විසින් සාදන ලද 2015 මැයි මස 16 දාතම හා අංක 2287 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : පිඹුරු අංක 992 හි ලොට් C යන එම ඉඩමේ ඉතිරි කොටසේ පැළඉනි වැට සහ මොව්බ්‍රේ එස්ටේට් එම ඉඩමේ ඉතිරි කොටස, වයඹට : පිඹුරු අංක 992 හි ලොට් C වෙන් කෙරෙන පැළඉනි වැට නැගෙනහිරට : වතුයායේ පාර සහ ඉවුර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් තුනයි දශම පහක් (අ. 1, රූ. 0, පර්. 3.5) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 2287 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිුරුව A 550/23 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 2287 දරන පිඹුරේ නිරූපිත සියළුම මාර්ග වෙන්කිරීම් දිගේ ඒ යටින් ඒ මතින් වෙනත් සම්බන්ධ අයිතීන් සහ ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමගය.

උකස් බැඳුම්කර අංක 1148 ප්‍රකාර හා ඒ යටතේ උකස්කොට ඇපකොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05 - 501

---

### යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින්මතු ඇතැම් තැනක ''යුනියන් බැංකුව'' වශයෙන් හඳුන්වන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 මාර්තු මස 28 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, මාරවිල, ඉහල හත්තිනිය, අංක 17/A දරන ස්ථානයේ පදිංචි ගල්ගමගේ චමින්ද කුමාරසිරි සිල්වා (ජාතික හැඳුනුම්පත් අංක 732013130V දරන) (මෙහි මින්මතු ඇතැම් තැනක ''බන්ධනදායි'' වශයෙන් හඳුන්වන) යන අය විසින් රුපියල් අසූලක්ෂයක (රු. 8,000,000) නිවාස ණය පහසුකමක් (මෙහි මින්මතු ඇතැම් තැනක ''එකී මූල්‍ය පහසුකම'' වශයෙන් හඳුන්වන) ලබාගෙන ඇති බැවින් ද, එකී බන්ධනදායි විසින් රුපියල් අසූලක්ෂයක (රු. 8,000,000) මුදලක් සඳහා ප්‍රසිද්ධ නොතාරිස් ආර්.එම්.එන්.ඩබ්ලිව්. රාජකරුණා විසින් සහතික කරන ලද අංක 30381 සහ 2016.01.04 වැනි දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට තබා, එකී මූල්‍ය පහසුකම් යුනියන් බැංක් ඔෆ් කලම්බු පීඑල්සී (ලියාපදිංචි අංක PB 676 PQ දරන) වෙත අයවිය යුතු ශ්‍රී ලංකා රුපියල් අසූලක්ෂයක (රු. 8,000,000) මුදල සහ ඒ මත පොළිය ගෙවීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන නිශ්චල දේපළ ඇපයක් වශයෙන් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, ඒ අනුව, එකී ණය පහසුකම් නිසා 2018.01.29 වැනි දිනට මුළු හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් අසූහතරලක්ෂ හතලිස් හතරදහස් අටසියහැටඑකකුත් ශත හතලිස්අටක (රු. 8,444,861.48) මුදලක් සහ හිඟ මුල් මුදල වන ශ්‍රී ලංකා රුපියල් හැත්තෑපන්ලක්ෂ හැත්තෑඅටදහස් හයසියහැටහතකුත් ශත අනූපහක (රු. 7,578,667.95) මුදල මත 2018.01.30 වැනි දින සිට එකී දේපළ විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 19% බැගින් තවදුරටත් පොළිය ද එකී බන්ධනදායිගෙන් යුනියන් බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද,

ඉහත කී ණය ශේෂය හෝ ඉන් යම් කොටසක් එකී බන්ධනදායි විසින් ගෙවා පියවා දැමීම පැහැර හැරීම සිදු කර ඇති බවට යුනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව යුනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලය ප්‍රකාරව ක්‍රියා කරමින්, ප්‍රසිද්ධ නොතාරිස් ආර්.එම්.එන්.ඩබ්ලිව්. රාජකරුණා විසින් සහතික කරන ලද අංක 30381 සහ 2016.01.04 වැනි දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය ප්‍රකාරව යුනියන් බැංකුව වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපල, එකී මූල්‍ය පහසුකම් මත 2018.01.29 වැනි දිනට මුළු හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් අසූහතරලක්ෂ හතලිස්හතරදහස් අටසියහැටඑකකුත් ශත හතලිස්අටක (රු. 8,444,861.48) මුදලක් සහ හිඟ මුල් මුදල වන ශ්‍රී ලංකා රුපියල් හැත්තෑපන්ලක්ෂ හැත්තෑඅටදහස් හයසියහැටහතකුත් ශත අනූපහක (රු. 7,578,667.95) මුදල මත 2018.01.30 වැනි දින සිට දේපල විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 19% බැගින් තවදුරටත් පොළිය ද, තව ද, ඉහත කී අංක 30381 දරන උකස් බැඳුම්කරය සහ 1990 අංක 4 දරන එකී පනතේ 13 වැනි වගන්තිය යටතේ යුනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියළු ම මුදල් ප්‍රමාණයන් ද අයකර ගැනීම සඳහා ඉහත කී 1990 අංක 4 දරන පනත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් වෙත බලය පැවරීමට 1990 අංක 4 දරන එකී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### ඉහත කී උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, රජගම ප්‍රාදේශීය සභා සීමාවේ, හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 44E දරන දොලිකන්ද ග්‍රාමසේවා නිලධාරි වසමේ බූස්සේ පිහිටි "මහගෙදරවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී.එම්. බුද්ධදාස විසින් මැන සාදන ලද අංක 63 සහ 2004.05.10 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 2 දරන බිම් කොටසට මායිම් උතුරට : දුම්රිය දෙපාර්තමේන්තුවට වෙන්කළ බිම් කොටස සහ ගල්හේන වත්ත ද, නැගෙනහිරට : කැබලි අංක 3, එම ඉඩමේම කොටසක් ද, දකුණට : ගුරුන්නාන්සේගේ වත්ත සහ ගාල්ල-කොළඹ මහාමාර්ගය ද, බස්නාහිරට : කැබලි අංක 1, මෙම ඉඩමේම කොටසක් ද, යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් දෙකක් පර්චස් විසිදෙකයි දශම හතයි බිංදුවක් (අ. 0, රූ. 2, පර්. 22.70) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ පලතුරු ආදි සෑම සියලු දේත් සමඟය. මෙම දේපළ ගාල්ල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක L/30/139 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ඉනෝකා ජයවර්ධන,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

05 - 519

---

### හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මීගමුව මෙට්‍රො ශාඛාව

**1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතියයි**

නම : වර්ණකුලසූරිය තුෂාර අරවින්ද ප්‍රනාන්දු

2018 මාර්තු මස 28 වන පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒක ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ජී. එම්. එම්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි නමට ලියන ලද්දාවූද 2016 සැප්තැම්බර් මස 02 වැනි දින සහතික කළ අංක 5560 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වර්ණකුලසූරිය තුෂාර අරවින්ද ප්‍රනාන්දු ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැට ලක්ෂ එකොළොස් දහස් හැත්තෑ අටයි ශත තිස් දෙකක (රු. 6,011,078.32) ක කාලින ණය මුදලක් 2017 නොවැම්බර් මස 30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්ද එකී රු. 6,011,078.32 ක මුදල අයකර ගැනීම සඳහා 2017 දෙසැම්බර් මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය ඇති කාලයට වැඩිදුර පොළියද, ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩුකොට එකී අංක 5560 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූද දේපල හා පරිශ්‍රය මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු පි. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරනලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ (මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ), ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, දූනගහ පත්තුවේ, කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ දෙමන්හංදිය උප කාර්යාලයේ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සෙල්ලකන්ද අංක 161සී ග්‍රාම නිලධාරි වසමේ මහහුණුපිටිය පිහිටි බදුල්ලගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ජේ. එම්. ජී. ඩයස් විසින් 1990 දෙසැම්බර් මස 12 වැනි දින මැන සාදන ලද අංක 1522ඒ/90 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 2 සහ බලයලත් මිනින්දෝරු ඩබ්. ජේ. එම්. ජී. ඩයස් විසින් 2006 ජූලි මස 27 වැනි දින මැන සාදන ලද අංක 1522ඒ/90 දරන සහතික කරන ලද ඉඩමට මායිම් වශයෙන් උතුරට : ලොට් 1 සහ ඇලෙන් ද, නැගෙනහිරට : ලොට් 3 න් ද, දකුණට : පාරෙන් ද (මහාමාර්ගය) සහ බස්නාහිරට : ලොට් 1 න් ද මායිම් වූ එකී අංක 1522ඒ/90 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විස්සයි දශම පහයි බිංදුවක (අ:0. , රූ. 0, පර්. 20.50) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළු දේත් සමඟ වේ.

මණ්ඩලයේ අණපරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

05-526/2

---

### හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - ඌරුබොක්ක ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතියයි

නම : මදුර රාජපක්ෂ

2018 මාර්තු මස 28 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදි.

අම්බලන්තොට ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. අමරසේන විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි නමට ලියන ලද්දා වූද 2015 ජුනි මස 22 වැනි දින සහතික කළ අංක 14990 සහ මාතර ප්‍රසිද්ධ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එන්. චන්ද්‍රලතා විසින් 2016 මාර්තු මස 12 දින සහතික කළ අංක 9610 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මදුර රාජපක්ෂ ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් දෙකෝටි හැට එක්ලක්ෂ තිස්නම දහස් අටසිය දොළහයි ශත හැත්තෑවක (රු. 26,139,812.70) මුදලක් 2018 ජනවාරි මස 31 වැනි දින හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 26,139,812.70 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2018 පෙබරවාරි මස 01 වැනි දින සිට දේපල විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 14990 සහ 9610 දරන බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පළවන සහ දෙවන උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය මුළු දිවයිනටම බලයත් මිනින්දෝරු ජේ. ඩබ්. ඊ. ජයවර්ධන ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරනලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### පළමු උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක් කෝරලේ, පස්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ ගින්නලිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගින්නලිය හි පිහිටි (එෆ්.වී.පී. 22 ලොට් 53ඒ) මහහේන, මලිත්තිගේහේන සහ දෙල්ගහහේන නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ජේ. ජයසේකර විසින් 2015 ජුනි මස 13 වැනි දින පිළියෙල කරන ලද අංක 117/2015 දරන පිඹුරෙන් බෙදා වෙන්කරන ලද ලොට් 8ඒ දරන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : අංක 1163 දරන පිඹුරේ ලොට් 5 සහ ඉහත සඳහන් අංක 117/2015 දරන පිඹුරේ ලොට් 8බී (පාර) නැගෙනහිරට : අංක 1163 දරන පිඹුරේ ලොට් 10 සහ ලොට් 11 (පොදු පාර) න්ද දකුණට : එෆ්. වී. පී. 22 හි ලොට් 53 එච් සහ අංක 1163 දරන පිඹුරේ ලොට් 10 සහ බස්නාහිරට : එෆ්. වී. පී. 22 පිඹුරේ ලොට් 46 සහ ගොඩහේනේන්ද මායිම් වූ පිඹුර ප්‍රකාරව අක්කර දොළහයි රූඩ් දෙකයි පර්චස් හයයි දශම හතයි අටක (අ. 12, රූ. 2, පර්. 6.78) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගහකොළ සහ එහි පිහිටි සියළුම දේත් සමඟ වේ.

02. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක් කෝරලේ, පස්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ ගින්නලිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගින්නලිය හි පිහිටි (එෆ්.වී.පී. 22 හි ලොට් 53ඒ) මහහේන මලිත්තිගේහේන සහ දෙල්ගහහේන නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. යූ. අබේගුණවර්ධන විසින් 1996 ජනවාරි මස 05 වැනි දින පිළියෙල කරන ලද අංක 1163 දරන පිඹුරෙන් බෙදා වෙන්කරන ලද ලොට් 09 දරන ඉඩම් කොටසට මායිම් වශයෙන් : උතුරට : ගල්ලින්ද හේන සහ මහමැදිරිහේන සහ මෙම ඉඩමේම ලොට් 04, 06 සහ 07 න් ද, නැගෙනහිරට : මහමැදිරිහේනේන් ද, දකුණට : මෙම ඉඩමේම ලොට් 10 සහ දංගහකුඹුරෙන් ද සහ බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් 06, 07 සහ 10 සහ මෙම ඉඩමේම ලොට් 11 (පොදු පාර) න් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව අක්කර දහතුනයි රූඩ් තුනයි පර්චස් බිංදුවයි දශම අටයි හතක (අ. 13, රූ. 3, පර්. 0.87) විශාලත්වයෙන් වූ ඉඩම සහ ගහකොළ සහ එහි පිහිටි සියළුම දේත් සමග වේ.

### දෙවන උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරලේ, පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැකිලියාතැන්න ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඌරුබොක්ක හි පිහිටි මනන්කැටියාවලහේන හෙවත් මනන්කැටියහේන යාබදව ඇති ලොට් අංක 1, 2 හි ලොට් 4 හි ලොට් 16 නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. වී. පී. බී. කීර්තිලාල් විසින් 2013 සැප්තැම්බර් මස 28 වැනි දින පිළියෙළ කරන ලද අංක 196/2013 දරන පිඹුරෙන් බෙදා වෙන්කරන ලද ලොට් අංක ඩී1 දරන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : අංක 320 දරන පිඹුරේ (පාර) ලොට් 2 න් ද, නැගෙනහිරට : අංක 320 දරන පිඹුරේ ලොට් 05 න් ද, දකුණට : මෙම පිඹුරේම ලොට් ඩී2 න් ද සහ බස්නාහිරට : අංක 321 දරන පිඹුරේ (පාර) ලොට් අංක 7 න්ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් තිස්තුනක (අ. 0, රූ. 0, පර්. 33) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි ගහකොළ වගාවන් සහ එහි පිහිටි සියළුම දේත් සමඟ වේ.

මණ්ඩලයේ අණපරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

05-526/3

---

### හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - වත්තල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතියයි

නම : තිත්ලපිටිගේ දිනුක ජයමාල් අර්නස්ට් ෆොන්සේකා පරණවිතානගේ දුලානි නිසංසලා දිනේෂිකා ෆොන්සේකා

2018 මාර්තු මස 28 වැනි පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පි. එම්. මොහොට්ටි විසින් සහතික කරන ලද්දා වූද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූද 2011 ජුනි මස 09 වැනි දින සහතික කළ අංක 4690 සහ 2016 සැප්තැම්බර් මස 23 දින සහතික කළ අංක 6651 දරන බැඳුම්කරයන් යටතේ ලබා දුන් වෙනත් ණය පහසුකම් අතර ස්ථිර අයිරා සහ වාරික ණය පහසුකම් සඳහා පමණක් අයවිය යුතු මුදල් සහ ලැබිය යුතු මුදල් ගෙවීම තිත්තලපිටිගේ දිනුක ජයමාල් අර්නස්ට් ෆොන්සේකා සහ පරණවිතානගේ දුලානි නිසංසලා දිනේෂිකා ෆොන්සේකා ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් තුන්කෝටි අනූනමලක්ෂ දහනමදහස් හයසිය පහයි ශත දාහතරක (රු. 39,919,605.14) මුදලක් 2018 ජනවාරි මස 18 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්ද එකී රු. 39,919,605.14 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2018 ජනවාරි මස 19 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 4690 සහ 6651 දරන බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තාවුද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූද දේපළ හා පරිශ්‍රයන් කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩී. කේලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහනගර සභා සීමාව තුළ බම්බලපිටිය හි පිහිටි බම්බලපිටිය පාරේ වරිපනම් අංක 40 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ආර්. යාපා විසින් 1977 පෙබරවාරි 21 වන දින පිළියෙල කරන ලද අංක 2728 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : වරිපනම් අංක 36 දරන පරිශ්‍රයෙන් ද, නැගෙනහිරට : ගාලු පාරෙන් ද, දකුණට : ලොට් 2න් ද සහ බස්නාහිරට : ගාලු පාරේ වරිපනම් අංක 48 දරන පරිශ්‍රයෙන් ද මායිම් වූ එකී අංක 2728 දරන පිඹුර ප්‍රකාරව පර්චස් එකොළහක (අ. 0, රූ. 0, පර්. 11) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළුම දේත් සමග වේ.

ඉහත සඳහන් ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ලෝකනාදන් විසින් 2002 ඔක්තෝබර් මස 08 වැනි දින අංක 5216/එක්ස් දරන පිඹුරට අනුව නැවත මැනීමකින් එය පහත සඳහන් පරිදි සවිස්තරව විස්තර වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහනගර සභා සීමාව තුල බම්බලපිටිය හි පිහිටි බම්බලපිටිය පාරේ වරිපනම් අංක 40 දරන ඉඩමට අංක 5216/එක්ස් දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : (බම්බලපිටිය පාර) වරිපනම් අංක 36 දරන පරිශ්‍රයෙන් ද, නැගෙනහිරට : ගාලු පාරෙන් ද, දකුණට : (බම්බලපිටිය පාර) වරිපනම් අංක 42 දරන පරිශ්‍රයෙන් ද සහ බස්නාහිරට : (බම්බලපිටිය පාර) වරිපනම් අංක 48 දරන පරිශ්‍රයෙන්ද මායිම් වූ එකී අංක 5216/එක්ස් දරන පිඹුරට අනුව විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළුම දේත් සමඟ වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

05-526/4

---

### හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කුරුණෑගල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ
4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතියයි

නම : ඒෂියන් ලෑන්ඩ්ස් ඇන්ඩ් හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2018 මාර්තු මස 28 වැනි පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හේවාපතිරණ විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී නමට ලියන ලද්දා වූද 2016 සැප්තැම්බර් මස 01 වැනි දින සහතික කළ අංක 4635 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඒෂියන් ලෑන්ඩ්ස් ඇන්ඩ් හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙකෝටි හැට දෙලක්ෂ එක් දහස් හාරසිය හැත්තෑ හයයි ශත හතලිස් හතක (රු. 26,201,476.47) මුදලක් 2018 ජනවාරි මස 31 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්ද එකී රු. 26,201,476.47 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2018 පෙබරවාරි මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 4635 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තාවූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූද දේපළ හා පරිශ්‍රය මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### ඉහත සඳහන් කළ උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, පරණකුරු කෝරළේ, උතුරු මාවත පත්තුවේ කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පිටිහුම කොට්ඨාස අංක 8 කෑගල්ල නගර සභා සීමාව තුළ ගොලහේල 51ඊ ග්‍රාම නිළධාරි වසමේ මීපිටිය පිටිහුම (බොහොර) ගමේ පිහිටි "රංවැටිය හේන කොටසක් වන රදෑල්ල එස්ටේට්" නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. ඩී. ප්‍රේමරත්න විසින් 2015 ජූලි මස 13 වැනි දින මැන සාදන අංක 76/2015 දරන පිඹුරෙන් බෙදා වෙන්කරන ලද ලොට් 01 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : කිරිට කැළෑවෙන් (රක්ෂිත වනාන්තරය) ද, ඊශානට : මෙම ඉඩමේම ඉතිරි කොටසෙන් ද, ගිණිකොණට : එඩ්වින් විජේරත්න මාවත වෙන්වෙන රද්දල ඇලෙන් ද (වඩාත් නිවැරදි එඩ්වින් විජේරත්න මාවත වෙන්වෙන සිමෙන්ති කාණුව ද), දකුණට : ආර්ඩීඒ පාරෙන් වෙන්වෙන සිමෙන්ති කාණුව සහ වෙන්කරන ලද ඇල රද්දල ඇලෙන් ද, බස්නාහිරට : කිරිට කැළෑව වෙන් කරන ලද කම්බි වැටෙන් ද, මායිම් වූ අක්කර පහයි රූඩ් එකයි පර්චස් දාහතරක (අ. 5 රූ. 1 පර්. 14) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

මණ්ඩලයේ අණපරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

05-526/5

---

### සම්පත් බැංකුව පීඑල්සී
### (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සම්පත් බැංකුව පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

කාංචන රෝලින් ෂටර්ස්.
ගිණුම් අංක 0043 1000 1142 සහ 0043 5001 2287.

2018.03.29 වන දින රජයේ ගැසට් පත්‍රයේ, පළවූ 03-1347 නිවේදනයේ යෝජනා සම්මුතියේ, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගත් දිනය 2017.02.31 ලෙස මුද්‍රණ දෝෂයකින් සඳහන් වී ඇති අතර, එම දිනය 2017.08.31 ලෙස නිවැරදි විය යුතු බව මෙයින් දන්වා සිටිමු.

දමිත් දෙහිපිටිය,
කළමනාකරු.
(ණය අයකර ගැනීම්)

2018 මැයි මස 04 වැනි දින,

05 - 527

---

### පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - කොල්ලුපිටිය ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගනුදෙනුකරුවන්ගේ නම් : අරුණ ප්‍රූඩ් රතුගමගේ සහ දුලානි සුජීවා රතුගමගේ.

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වර්ෂ 2018 ක් වූ මාර්තු මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්, ඉහත නම් සඳහන් අරුණ ප්‍රූඩ් රතුගමගේ සහ දුලානි සුජීවා රතුගමගේ යන අය විසින් බන්ධනදයින්/ උකස්කරුවන් ලෙස ලියාපදිංචි අංක පීකිව් 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. සූරියාරච්චි විසින් සහතික කරන ලද වර්ෂ 2016.07.01 වැනි දිනැති අංක 767 දරන උකස්කරය මත සහ වර්ෂ 2016.07.01 වැනි දිනැති අංක 769 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 767 සහ 769 දරන උකස්කරයන් මත,

(අ) වර්ෂ 2018 ක් වූ මාර්තු මස 06 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් දස මිලියන හාරලක්ෂ පහළොස්දහස් එකසිය අසූ හතයි ශත හැත්තෑ දෙකක (රු. 10,415,187.72) මුදලක් ද, වර්ෂ 2018 ක් වූ මාර්තු මස 07 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම වන තුරු රුපියල් දස මිලියනයක් (රු. 10,000,000) දක්වා වූ මුදල මත වර්ෂයකට 18% ක පොළිය ද,

(ආ) වර්ෂ 2018 ක් වූ මාර්තු මස 06 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් විසි අට ලක්ෂ තුන්දහස් හත්සිය අසූ හයයි ශත හයක (රු. 2,803,786.06) මුදලක් ද, වර්ෂ 2018 ක් වූ මාර්තු මස 07 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම වනතුරු රුපියල් විසි හත් ලක්ෂ තිස් හතර දහස් හැත්තෑ තුනයි ශත පණහක් (රු. 2,734,073/50) දක්වා වූ මුදල මත වර්ෂයකට 18% ක පොළිය ද,

ඉහත කී බන්ධනදයින්ගෙන්/ උකස්කරුවන්ගෙන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

ඉහත කී උකස්කරයන් මත අයවිය යුතු මුලු මුදල වන එකී රුපියල් දහතුන් මිලියන දෙලක්ෂ දහ අට දහස් නවසිය හැත්තෑ තුනයි ශත හැත්තෑ අටක (රු. 13,218,973/78) මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොළිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අයකර ගැනීම සඳහා මෙහි උපලේඛණයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපල, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව කොලොන්නාව, විහාර මාවතේ අංක 182/3 (50/3) හි පදිංචි බලයලත් වෙන්දේසිකරු තුසිත කරුණාරත්න වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ (මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ), ගම්පහ දිස්ත්‍රික්කයේ, රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ, ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුඳුවත්ත ඒකල 205 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කොටුගොඩ කුරුඳුවත්ත ඒකල ග්‍රාමයේ පිහිටි 6 වන පටුමගේ මිලේනියම් සිටි වරිපනම් අංක 32 දරන OTS ඉඩම නමැති බලයලත් මිනින්දෝරු එම්. ටී. රත්නායක විසින් මැන සාදන ලද 2003.02.28 දිනැති අංක 1971 දරන පිඹුරේ දැක්වෙන ලොට් 36 දරන කැබැල්ල නමැති (බලයලත් මිනින්දෝරු එම්. ටී. රත්නායක විසින් මැන සාදන ලද 2002.12.27 දිනැති අංක 1926 දරන පිඹුරේ දැක්වෙන ලොට් 3 හි නැවත මැනීමක් සහ කැබලි වෙන් කිරීමක් වන) උතුරින් : ලොට් ආර් 21 (කාණුව සහ වෙනත් සේවා) ද නැගෙනහිරින් : මෙම ඉඩමෙහි ලොට් 37 ද, දකුණින් : මෙම ඉඩමෙහි ලොට් 63, 64 සහ 65 ද බස්නාහිරින් : මෙම ඉඩමෙහි ලොට් 35 ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම තුනයි එකක් (අ. 0, රූ. 0, පර්. 13.31) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගහකොළ, වැව්ලි ආදී සියලු දෙය වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/ පත්ඉරු B 197/219 හි සහ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/ පත්ඉරු J 351/116 හි ලියාපදිංචි කර ඇත.

තවද පහත දැක්වෙන ඉඩම් මතින් සහ එය ඔස්සේ පයින් සහ වාහනවලින් ගමන් කිරීමට සහ නිර්බාධිත අයිතිය අවසරය සහ බලය ද විදුලි බලය සහ ජල සැපයුම් සඳහා බිම්ගතව සහ ගුවනින් සවිකිරීම් සහ සැකසීම් සඳහා වන අයිතීන් ද අනෙකුත් අයිතීන් ද සමග වේ.

01. බලයලත් මිනින්දෝරු එම්. ටී. රත්නායක විසින් මැන සාදන ලද 2003.02.28 දිනැති අංක 1971 දරන පිඹුරේ දැක්වෙන ලොට් ආර්7, ආර්2, ආර්3, ආර්21, ආර්44 සහ ආර්45 දරන කැබලි මතින්,

02. බලයලත් මිනින්දෝරු එම්. ටී. රත්නායක විසින් මැන සාදන ලද 2001.11.05 සහ 07 දිනැති අංක 1877 දරන පිඹුරේ දැක්වෙන ලොට් 2 සහ 4 දරන ප්‍රවේශ මාර්ගය දක්වා වූ (ආර්ඩීඒ) කැබලි මතින්,

03. බලයලත් මිනින්දෝරු එම්. ටී. රත්නායක විසින් මැන සාදන ලද 2003.02.28 දිනැති අංක 1971 දරන පිඹුරේ දැක්වෙන කාණු සහ මාර්ග භාවිතාවේ අයිතිය ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

උදිතා කොඩිකාර,
කළමනාකාරිණී - ණය අය කරගැනීම්.

05 - 529

---

### පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - පිටකොටුව ශාඛාව

1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගනුදෙනුකරුගේ නම : අයියසාමි කුමාරවේල්

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වර්ෂ 2018.04.25 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම්, අයියසාමි කුමාරවේල් බන්ධනාදයී උකස්කරු වශයෙන් ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. සූරියආරච්චි විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2016.03.30 දිනැති අංක 706 දරන උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 706 දරන උකස් බැඳුම්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂ 2018.04.02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හය මිලියන එක් ලක්ෂ අනූ තුන් දහස් තුන්සිය හතලිහයි ශත තිස් තුනක (රු. 6,193,340.33) මුදල සහ වර්ෂ 2018.04.03 වැනි දින සිට රු. 5,947,671.34 ක මුදල මත වාර්ෂිකව 20% බැගින් පොළිය ද සහ වර්ෂ 2018.03.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් දෙමිලියන හතලිස් දෙදහස් හත්සිය දහතරයි ශත හතලිස් තුනක (රු. 2,042,714.43) මුදල සහ වර්ෂ 2018.04.01 වැනි දින සිට රු. 2,000,000 ක මුදල දක්වා වාර්ෂිකව 24% බැගින් පොළිය ද, රු. 2,000,000 ක මුදල ඉක්මවන මුදල මත වාර්ෂිකව 29% බැගින් පොළිය ද, පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

එකී අංක 706 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් අට මිලියන දෙලක්ෂ තිස් හය දහස් පනස් හතරයි ශත හැත්තෑ හයක (රු. 8,236,054.76) මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලියද ගාස්තුද වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල්ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ අයියසාමි කුමාරවේල් බන්ධනාදයී වශයෙන් ද බැංකුව වෙත උකස්කර ඇති දේපල, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක. 182/3(50/3) දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර තුසිත් කරුණාරත්න වෙත එකී වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ (ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ), ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලේ - දකුණ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභාවේ හැදල උපකාර්යාලයේ සීමාව තුළ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නායක්කන්ද - අංක 172සී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හැදල ගමෙහි වරිපනම් අංක 52/40, කොන්වන්ට් පටුමගේ පිහිටි "දවටගහමූකලාන" නම් වූ ඉඩමට බලයලත් මිණුම්දෝරු එච්. ආර්. සමරසිංහ විසින් සාදන ලද අංක 2014 මාර්තු මස 31 වැනි දින අංක 7008 දරන සැළැස්මේ (බලයලත් මිනුම්දෝරු එච්. ආර්. සමරසිංහ විසින් මැන සාදන ලද වර්ෂ 1988.02.29 දින දරන අංක 891 දරන සළැස්මේ ලොට් අංක 1 වශයෙන් නිරූපිත ඉඩමේ කොටසකි) නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කර බෙද වෙන් කල ඉඩමට මායිම් උතුරට : ජෝර්ස් රොඩ්රිගු යන අයගේ ඉඩම ද, නැගෙනහිරට : මර්වින් ද සේරම් යන අයගේ ඉඩම ද, දකුණට : විජය පෙරේරා යන අයගේ ඉඩම ද සහ බස්නාහිරට : පාර ද යන මායිම් තුළ පිහිටියාවූ ද අංක 7008 දරන සැළැස්මට අනුව ප්‍රමාණයෙන් පර්චස් තිස්දෙකයි දශම නවයයි එකක (අ. 0, රූ. 0, පර්. 32.91) බෙද වෙන් කළ ඉඩම සහ ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ වැව්ලි සහ ඒ මත පිහිටි සෑම සියළු දේත් ය.

එකී ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එල් 115/116 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

එකී ලොට් 1 දරන ඉඩම මෙහි පහත විස්තර කර ඇති ඉඩමේ කොටසකට කරන ලද නැවත මැනීමකි.

බස්නාහිර පළාතේ (ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ), ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කොරළේ - දකුණ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභාවේ හැදල උපකාර්යාලයේ සීමාව තුල වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නායක්කන්ද දකුණ - අංක 172 සී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හැදල ගමෙහි, වරිපනම් අංක 52/40, කොන්වන්ට් පටුමගේ පිහිටි "දවටග හමූකලාන සහ කුඹුර" නම් වූ ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ආර්. සමරසිංහ විසින් සාදන ලද 1988 පෙබරවාරි මස 29 වැනි දින දරන අංක 891 දරන සැළැස්මේ ලොට් අංක 1 වශයෙන් මැන බෙද වෙන්කරන ලද ලොට් 1 වශයෙන් ලකුණු කර බෙද වෙන් කල ඉඩමට මායිම් උතුරට : ඒ. රොඩ්රිගු යන අයගේ ඉඩම ද, නැගෙනහිරට : මර්වින් ද සේරම් සහ ඔස්වල්ඩ් දන්තනාරායන යන අයගේ ඉඩම් ද, දකුණට : අංක 891 පිඹුරේ ලොට් 2 ද සහ බස්නාහිරට : අඩි 20 ක් පළල පාර (බලයලත් මිනුම්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් මැන සාදන ලද 1952.03.02 වැනි දින දරන අංක 319 දරන සැළැස්මේ ලොට් අංක B) ද, යන මායිම් තුළ පිහිටියා වූ ද ප්‍රමාණයෙන් පර්චස් තිස්හතරයි දශම හතරයි පහක (අ. 0, රූ. 0, පර්. 34.45) බෙද වෙන් කළ ඉඩම සහ ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ වැව්ලි සහ ඒ මත පිහිටි සෑම සියලු දේත් ය.

තවද, බලයලත් මිනුම්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් මැන සාදන ලද 1952.03.02 දින දරන අංක 319 දරන සැළැස්මේ ලොට් A, ලොට් B, ලොට් D, ලොට් G දරන ඉඩම් කොටස් මතින් සහ ඒ ඔස්සේ මාර්ග අයිතිවාසිකම් සමග ද වේ.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණපරිදි,

දේවිකා හල්වතුර,
කළමණාකාරිණී - අය කරගැනීම්.

05 - 531

---

### පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - පේරාදෙණිය ශාඛාව

1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුවන්ගේ නම් : දොන් නිහාල් ජයම්පති ලියනගේ සහ
ජයලත් මුදියන්සේලාගේ අමරා ගල්ගමුව

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වර්ෂ 2018.04.25 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම්, දොන් නිහාල් ජයම්පති ලියනගේ උකස්කරු බන්ධනාදායි වශයෙන් ද සහ ජයලත් මුදියන්සේලාගේ අමරා ගල්ගමුව බන්ධනදයි වශයෙන් ද, කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුන ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් නිල්නි වෑගොඩපොල විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2016.06.08 දිනැති අංක 1860 දරන උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 1860 දරන උකස් බැඳුම්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දිනය තෙක් වර්ෂ 2018.03.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළියද වශයෙන් රුපියල් පන් මිලියන තුන් ලක්ෂ තිස් දහස් හත්සිය නවයයි ශත හැත්තෑ එකක (රු. 5,330,709.71) මුදල සහ වර්ෂ 2018.04.01 වැනි දින සිට රු. 5,000,000 ක මුදල දක්වා වාර්ෂිකව 18% බැගින් පොළියද රු. 5,000,000 ක මුදල ඉක්මවන මුදල මත වාර්ෂිකව 29% බැගින් පොළිය ද, පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

එකී අංක 1860 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් පන් මිලියන තුන් ලක්ෂ තිස් දහස් හත්සිය නවයයි ශත හැත්තෑ එකක (රු.

5,330,709.71) මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලියද ගාස්තු ද වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛණයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තාවූ බැංකුව වෙත දොන් නිහාල් ජයම්පති ලියනගේ උකස්කරු බන්ධනදයී වශයෙන්ද සහ ජයලත් මුදියන්සේලාගේ අමරා ගල්ගමුව බන්ධනදයී වශයෙන් ද උකස්කර ඇති දේපල, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, මාවිල්මඩ, දුටුගැමුණු මාවත, අංක 369/1, දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය වෙත එකී වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස ය.

### උපලේඛනය

1. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ (මහනුවර ලියාපදිංචි කොට්ඨාසය ඇතුළත), උඩුනුවර ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වලගෙදර උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වලගෙදර පිහිටි බලපත්‍රලත් මිනින්දෝරු ඩබ්ලිව්. එම්. එම්. ඒ. විජේකෝන් විසින් මූණමල්ග හමුල හේන, තලවතුර, පල්කඩ හේන, අමුකොටුවේ හේන, කොයුවේ හේන යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමේ සාදන ලද වර්ෂ 2010 ක්වූ නොවැම්බර් මස 08 වැනි දිනැති අංක 2658 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 සලකුණු කොට ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස, එකී ඉඩම් කොටසට මායිම් : ඊසානට : ලොට් 1 ද, ගිණිකොනට : ලොට් 2 ද සහ ලොට් 3 ද වශයෙන් සලකුණු කර ඇති මාර්ගය ද, නිරිතට : අංක 540 දරන පිඹුරේ දැක්වෙන ඉඩමේ ඉතිරි කොටස වෙන් කෙරෙන වැට ද, සහ වයඹට : අමුකොටව වෙන් කෙරෙන කාණුව ද, වන ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් නවයක් (අ. 0, රූ. 1, පර්. 39) වන එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ පලතුරු සහ සියලුම දේ සමග වූ ඉඩම් කොටස, මෙය මහනුවර ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ C469/124 සහ 123 හි ලියාපදිංචි කර ඇත.

2. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ (මහනුවර ලියාපදිංචි කොට්ඨාසය ඇතුළත), උඩුනුවර ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වලගෙදර උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වලගෙදර පිහිටි බලපත්‍රලත් මිනින්දෝරු ඩබ්ලිව්. එම්. එම්. ඒ. විජේකෝන් විසින් මූණමල්ගහමුල හේන, තලවතුර, පල්කඩ හේන, අමුකොටුවෙ හේන, කොයුවේ හේන යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමේ සාදන ලද වර්ෂ 2010 ක් වූ නොවැම්බර් මස 08 වැනි දිනැති අංක 2658 දරන පිඹුරේ නිරූපිත ලොට් 3 සලකුණු කොට ඇති බෙදා වෙන්කරන ලද (ප්‍රවේශය) ඉඩම් කොටස, එකී ඉඩම් කොටසට මායිම් : ඊසානට : ලොට් 1 ද, ගිණිකොනට : පරණ පට්ටිය සිට පිළිමතලාව දක්වා දිවෙන මාර්ගය ද, නිරිතට : අංක 540 දරන පිඹුරේ දැක්වෙන ඉඩමේ ඉතිරි කොටස වෙන් කෙරෙන වැට ද, වයඹට : ලොට් 2 වන ප්‍රමාණයෙන් පර්චස් හතරක් (අ. 0, රූ. 0, පර්. 04) වන ඉඩම් කොටස.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණපරිදි,

දේවිකා හල්වතුර,
කළමණාකාරිණී - අය කරගැනීම්.

05 - 533

---

### ඩී.එෆ්.සීසී බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරණ බැංකු මගින් ප්‍රදානය කරන ලද ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2017 නොවැම්බර් මස 29 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන එස්. හපුතන්ත්‍රී, එන්. එස්. රණතුංග, බී. එස්. අබේවික්‍රම විසින් ලියා සහතික කරන ලද 2014.10.27/2014.10.30/2014.11.05 දිනැති අංක 2181/758/181 උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන එස්. හපුතන්ත්‍රී, එන්. එස්. රණතුංග, සී.වී.කේ. මුදලිගේ විසින් ලියා සහතික කරන ලද 2014.10.27/2014.10.30/2014.11.07 දිනැති අංක 2183/757/146 උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම, මහනුවර පදිංචි මේරි ඈන් ඩිලීෂියා වික්‍රමසිංහ සහ පතිරණ වත්තේ සමන් පතිරණ නොහොත් පතිරණවත්තේ සමන් පතිරණ යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2017 සැප්තැම්බර් මස 29 වැනි දිනට එකී මේරි ඈන් ඩිලීෂියා වික්‍රමසිංහ සහ පතිරණ වත්තේ සමන් පතිරණ නොහොත් පතිරණවත්තේ සමන් පතිරණ යන අයගෙන් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත ඉහත කී අංක 2181/758/181 සහ අංක 2183/757/146 දරන උකස් බැඳුම්කරයන් මත රුපියල් අසූ හය ලක්ෂ අටසිය අනූ දෙකයි ශත හතලිස් හයක (රු. 8,600,892.46) මුදලක් ද, 2017 සැප්තැම්බර් මස 30 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් අසූ එක් ලක්ෂ හතලිස් අට දහස් එකසිය විස්සක (රු. 8,148,120) මුදල මත (වාර්ෂිකව සියයට දහතුනයි දශම පහක් (13.5%) වූ අවම අනුපාතයකට යටත්ව) සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) ඉහළින් ආසන්නතම 0.5% ට වටයනු ලබන්නා වූ සියයට හතයි දශම පහක් (7.5%) වූ පොළී අනුපාතිකය මත වන වැඩිදුර පොළිය ද අයවිය යුතුව සහ ගෙවිය යුතුව ඇති බැවින් ද,

තව ද, එකී මුදල වන රුපියල් අසූ හය ලක්ෂ අට සිය අනූ දෙකයි ශත හතලිස් හයක (රු. 8,600,892.46) මුදලක් ද, 2017 සැප්තැම්බර් මස 30 වන දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් අසූ එක් ලක්ෂ හතලිස් අට දහස් එකසිය විස්සක (රු. 8,148,120) මුදල මත (වාර්ෂිකව සියයට දහතුනයි දශම පහක් (13.5%) වූ අවම අනුපාතයකට යටත්ව) සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) ඉහළින් ආසන්නතම 0.5% ට වටයනු ලබන්නා වූ සියයට හතයි දශම පහක් (7.5%) වූ පොළී අනුපාතිකය මත වන වැඩිදුර පොළිය ද හෝ විකිණීමේ අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරි වී ඇති යම් කොටසක් 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියේ නියමයන් යටතේ ඉහත කී උකස් බැඳුම්කරයේ ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් වැයකර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අයකිරීම් ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 2181/758/181 සහ අංක 2183/757/146 දරන උකස් බැඳුම්කරයන් මගින් මේරි ඈන් ඩිලීෂියා වික්‍රමසිංහ සහ පතිරණ වත්තේ සමන් පතිරණ නොහොත් පතිරණවත්තේ සමන් පතිරණ විසින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර කරන ලද ඉඩම සහ ගොඩනැගිල්ල, ෂොක්මන් ඇන්ඩ් සමරවික්‍රම කොළඹ බලයලත් වෙන්දේසිකරු ලවා විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

### අංක 2181/758/181 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල පිළිබඳ විස්තරය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එප්පාවල කෝරළේ අංක 390 ඉහළ සියඹලාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඉහළගම ගමේ (අවසාන ගම් සිතියම් 378) පිහිටි ගොඩඉඩම නැමැති ඉඩමට (අවසාන ගම් සිතියම් 378 හි ලොට් 1 A C සහ ලොට් 5 වන සහ 2001.01.21 දිනැති අනු/තලාව/ප්‍රා/1416 දරන ජයභූමි ඔප්පුවේ ද විස්තරවන) බලයලත් මිනින්දෝරු ඒ. එම්. බී. රත්නසිරි විසින් මැන සකස් කරන ලද 2002 පෙබරවාරි මස 02 දිනැති අංක 1031 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 දරන ඉඩම් කොටසට මායිම් උතුරට : අවසාන ගම් සිතියම් 378 හි ලොට් 1 AC සහ ලොට් 5 ද, නැගෙනහිරට : ඇළ ඔස්සේ වෙන්කිරීම ද, දකුණට : අවසාන ගම් සිතියම් 378 හි ලොට් 1 AC සහ ලොට් 5 ද සහ බස්නාහිරට : පාර (මාර්ග සංවර්ධන අධිකාරිය) ද වශයෙන් මායිම් වූ එකී අංක 1031 පිඹුරට අනුව ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් විසි අටක් (අ 0, රූ. 3, පර්. 28) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි ගහකොළ වැවිලි ඇතුලු සියලු දේ ද වේ.

ඉහත ඉඩම පහත විස්තර කරන ඉඩමේ නැවත මැනීමකි.

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාත දකුණ සහකාර උප සභාපති කොට්ඨාසයේ, දකුණු නුවරගම් පළාත කෝරළේ අංක 390 ඉහළ සියඹලාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඉහළගම ගමේ පිහිටි උතුරට: ලොට් 5 සහ ලොට් 1 AC ද, නැගෙනහිරට: ඇළ ඔස්සේ වෙන්කිරීම ද, දකුණට: ලොට් 5 සහ ලොට් 1 AC ද සහ බස්නාහිරට : එප්පාවල - තලාව මාර්ග ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් විසි අටක් (අ. 0, රූ. 3, පර්. 28) විශාල ඉඩම වේ. මෙය අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත.

### අංක 2183/757/146 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහනුවර මහනගර සභා බලසීමාව තුළ අංක 236 බහිරවකන්ද ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බහිරවකන්ද පිහිටි තික්කාමඩිත්තේහේන නමැති ඉඩමට (මහනුවර දිසා අධිකරණයේ අංක 46228 දරන නඩුවේ ලොට් 4 හි කොටසක් වන) බලයලත් මිනින්දෝරු ආර්.සී.ඕ. ද ලා මොටේ විසින් මැන සකස් කරන ලද 1979.08.26 දිනැති අංක 2023A දරන පිඹුරේ දැක්වෙන ලොට් 4E1 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරු - නැගෙනහිරඃ හනීෆා බීබීට අයත් මෙම ඉඩමේ ඉතිරි කොටස ද, දකුණු-නැගෙනහිරටඃ ලොට් E වශයෙන් ලකුණු කරන ලද ඉතිරි කොටස ද, දකුණු-බස්නාහිරටඃ ලොට් F වශයෙන් ලකුණු කරන ලද මෙම ඉඩමේ ඉතිරි කොටස ද සහ උතුරටඃ හෙන්රික් පෙරේරාට අයත් ඉඩම වෙන් කෙරෙන කාණුව ද වශයෙන් මායිම් වූ එකී අංක 2023 A පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම සහ එහි පිහිටි සියලු දේ ද, හනීෆා බීබීට අයත් ඉඩමේ මාර්ග ප්‍රවේශය වශයෙන් ලකුණු කරන ලද අඩි 4ක් පළල පාර ද සමග වේ.

ලක්ෂමන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරී.

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී,
73/5, ගාලු පාර,
කොළඹ 03.

05 - 545